# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

මෙත් සවිය සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව
Methsaviya Newsletter

❊ මෙත් සවිය දහ හතර වන කාණ්ඩය ❊ තිස් දෙවන කලාපය
❊ 2018 මැයි

නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙත් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා




මෙත් සවිය භාවනා මධ්‍යස්ථානය - ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: ක: 0714 0144 67, 0112 50 50 88
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපැල : office@methsaviya.org



# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

හෙළදිවට බුදුහිමි වැඩමකර
වසර 2600 ක් සපිරීම
නිමිතිකොට
2012/01/08 වන
දුරුතු පොහෝ දින
ඓතිහාසික මහියංගන
රාජමහා විහාර පුදබිමෙහි
අඩි 84 ක් උසැති
බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙලීම
මෙත් සවිය විසින් අරඹන ලදී.

ඇස්තමේන්තු ගත මුදල
**රුපියල් ලක්ෂ 550 ක්**
පමණ වේ.







## 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙලීමේ

**දැක්ම :** බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකාගමනය සිදු වූ ඓතිහාසික මහියංගන රාජමහා විහාර භූමියෙහි අසූහාර දහසක් ධර්මස්කන්ධයන් සිහිවන සේ අඩි 84ක උසින් යුක්ත ව අහසින් වඩින ආකාරයට, අඩි 84ක් උසැති ලක්දිව උස ම හිටි පිළිමවහන්සේ වන 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමාවහන්සේ ඉදිකිරීම.

**අරමුණ :** අප තථාගත ගෞතම බුදුරජාණන්වහන්සේ බුද්ධත්වයෙන් නම මසක් ඇවෑමෙන් වූ දුරුතු පුර පසළොස්වක පොහෝ දින ශ්‍රී ලංකාද්වීපයේ මහියංගනයේ මහවැලි නදිය අසබඩ මහානාගවන නම් වූ උද්‍යානයෙහි පැවැත්වෙන මහායක්ෂ සංගමය දිවැසින් දැක පළමුවර ශ්‍රී ලංකාවට වැඩම කොට, ඉහළ අහසේ පෙනී සිට, නොයෙකුත් ප්‍රාතිහාර්ය දක්වා යක් පිරිස් දමනය කර, ඔවුන් ගිරි දිවයිනට යවා, මෙම දිවයින ධර්මයෙහි පැවැත්වීමට සුදුසු ස්ථානයක් බවට පත්කළ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාද පද්ම ස්පර්ශයෙන් පවිත්‍ර වන ලද්දා වූ ද, බුදුරජාණන් වහන්සේ ජීවමාන ලෙස වැඩසිටි කාලයේ දී ම තනන ලද්දා වූ ප්‍රථම චෛත්‍ය රාජයාණන් වහන්සේ ලෙස මහාවංශය ඇතුළු මූලාශ්‍රයන් හි සඳහන් වන ඓතිහාසික මහියංගන රාජමහා විහාරයට අයත් පුදබිමෙහි මෙතෙක් බුදුපිළිමයක් ගොඩනගා නැතිබැවින් එම අඩුව සපුරා බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සමරණු පිණිස ද, ඒ වෙනුවෙන්, බුද්ධශාසනය අවසානය වන තෙක් පවතින රට ලෙස සැලකෙන ශ්‍රී ලංකාද්වීපයෙහි චිරාත්කාලයක් පවත්නා පූජා වස්තුවක් ලෙස අසූහාරදහසක් ධර්මස්කන්ධයන් සිහිවන සේ අඩි 84ක උසින් යුක්ත ව අහසින් වඩින ආකාරයට අධාරකයක් නොමැති ලක් දිව උස ම හිටි පිළිමය වන 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ ගොඩනගා බුදුන් වැඩි ස්ථානයෙහි බුද්ධාලම්බන ප්‍රීතිය වැඩිවන අයුරින් බැතිමතුන් හට වන්දනා මාන කර කුසල් රැස්කරගැනීමට අවස්ථාව සැලසීම සහ බුද්ධ ශාසනයෙහි චිරස්ථිතිය පිණිස උපයෝගී වීම.

## මෙම අටමහා කුසල කර්මයට ඔබත් දායකවීමට කැමති නම් විමසන්න

☎ 0714 0144 67, 0112 50 50 88 ✉ office@methsaviya.org

බුද්ධ ප්‍රතිමා වහන්සේ ඉදිකිරීම සඳහා වන සියළුම ආධාර **"සම්පත් බැංකුවේ ( 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා අරමුදල )** නමින් ඇති **"000560001118"** ගිණුමට බැර කරන්න.

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

15 සංවත්සරය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06.
දු:ක: 0714 014467 / 0112 505088 වෙබ් අඩවිය : www.methsaviya.org / www.methsaviya.lk විද්‍යුත් තැපෑල : office@methsaviya.org

සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව ❊ 2018 මැයි ❊ මෙත් සවිය දහ හතර වන කාණ්ඩය ❊ තිස් දෙක වන කලාපය


## මෙත් සවිය 2017 / 2018 වසර සඳහා මහ සමුළුවේ දී තේරී පත් වූ විධායක කමිටුව

**ගරු පැවිදි අනුශාසක**

ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත, වංසාලංකාර අමරපුර නිකායේ ගරු අධිකරණ සංඝනායක

අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන් වහන්සේ

**ගරු සභාපති**

විද්‍යා කීර්ති, ශාසනදීපන, ලෝකාර්ථචාරී, විද්‍යාවාචස්පති, දේශමාන්‍ය, විශ්ව විද්‍යා අධිමනෝවිද්‍යාවේදී, නාලන්දා කීර්ති ශ්‍රී

මහාචාර්ය චන්දන ජයරත්න මහතා.

දු.ක : 0714800800 ෆැක්ස් : 0115678000

විද්‍යුත් ලිපිනය : chandanajayaratne@gmail.com

**ගරු උප සභාපති**

වෛද්‍ය චන්දිම මාරසිංහ මහතා. දු.ක : 071 229 9212

චින්තක බණ්ඩාර මහතා. දු.ක : 071 811 4477

**ගරු සම ලේකම්වරු**

කෝසල එදිරිසිංහ මහතා. දු.ක : 071 632 2306

මංජුල පත්මකුමාර මහතා. දු.ක : 071 529 5855

**ගරු භාණ්ඩාගාරික**

චමින්ද ඉන්දික මහතා. දු.ක : 071 229 9212

**ගරු උප භාණ්ඩාගාරික**

සුරංග ලියනගේ මහතා. දු.ක : 077 599 4987

**ගරු සංස්කාරක**

එම්. කේ. ප්‍රියන්ත මහතා. දු.ක : 071 228 5680

**ගරු කාරක සභිකවරු**

මෙනුර ඩයස් මහතා / ජගත් ප්‍රසන්න මහතා
දර්ශන ගලප්පත්ති මහතා / මාලන් කන්දගේ මහතා
මහේන්ද්‍ර ජයනාත් මහතා / චේනුක ජයනාත් මහතා

**වෙබ් අඩවි සහ මාධ්‍ය කමිටුව - සභාපති**

දක්ෂිණ උදයංග මහතා

**බුදු පිළිම කමිටුව - සභාපති**

පී. ප්‍රේමදාස පෙරේරා මහතා

**කාන්තා කමිටුව - සභාපතිනිය**

රංජනී උඩුගොඩ මහත්මිය

**තරුණ කමිටුව - සභාපති**

උචිත ජයතිස්ස මහතා

**අසරණ සරණ කමිටුව - සභාපතිනිය**

එන්. එම්. දහනායක මහත්මිය

**සුව සෙත කමිටුව - සභාපති**

අතුල නානායක්කාර මහතා

**නීති උපදේශන කමිටුව - සභාපති**

චන්දන ජයතිස්ස මහතා

**දාන - ශිල - භාවනා කමිටුව - සභාපති**

පියල් චන්ද්‍රතුංග මහතා

**අධීක්ෂණ කමිටුව**

ජී. ජී. තිලකසිරි මහතා
වික්‍රම ගුණදාස මහතා

**සුභසාධක කමිටුව - සභාපති**

ධර්මසිංහ වික්‍රමආරච්චි මහතා

**අප ගැන වචනයක්**

**මෙත් සවිය සංසදය, නිරවුල් මනසක් ඇති, වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් වසර දහ හතරකට පෙර අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි.** වර්තමාන සාමාජික සංඛ්‍යාව 5,500 ඉක්මවා ඇත. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මේ මඟින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරනය, නායකත්ව පුහුණුව, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටන් වැනි ඒ ඒ කාලවල දී පවත්වන වැඩසටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක්, දාන - සීල - භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටුව හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ප්‍රධාන මූලස්ථානය ලෙස පවත්වා ගනිමින් **"මෙත් සවිය අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය"** පසුගිය දහහතර වසර පුරා සමථ විපස්සනා භාවනාව පන් දහස් පන්සීයකට අධික පිරිසකට උගන්වා ඇති අතර, ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කර ඇත. මීට අමතරව බෞද්ධ භාවනාවේ ප්‍රයෝජනය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ පවත්වමින් දෙස් විදෙස් ජාත්‍යන්තර සම්මන්ත්‍රන වලට එම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරනු ලබන, අප දන්නා පරිදි ලංකාවේ ඇති එකම ආයතනය ද **"මෙත් සවිය"** වේ. (මින් සමහරක් අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක). තවද මිරිසවැටිය සළපතල මළුව ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීම, නාගදිප වන්දනාවේ යන බැතිමතුන්ගේ පහසුව සඳහා වසර 30 ක දිගු යුද්ධය නිම වී මාස 06 ක් යාමට පෙර නාගදීපය සහ කිලිනොච්චියේ ලුම්බිණි විහාරයේ වැසිකිළි පද්ධතීන් සාදා නිම කොට පූජා කිරීම. මහියංගන රාජමහා විහාරයේ ලක්ෂයකට වැඩි පිරිසකට පිරිසිදු ජලය පානය කළ හැකි ජල පිරිපහදුවක් සාදා පූජා කිරීම. ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහල වීම සහ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවී වසර 2600 ක් ඉක්මවීම සැමරීම සඳහා අසූහාරදහසක් ධර්මස්කන්ධය සිහිවන අයුරින් ඓතිහාසික මහියංගන රාජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති **"2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුදු පිළිමය"** ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම, එසේම රෝද පුටු පරිත්‍යාග කිරීම, කොළඹ ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා මහරගම අපේක්ෂා රෝහල (පිළිකා රෝහල) ඇතුලු රෝහල් ගණනාවකට අවශ්‍ය උපකරණ ලබාදීම වැනි ලොකු කුඩා සත්කාරයන් රැසක් පසුගිය වසර දහ හතර පුරා ඉටුකර ඇත.

**සියලු ලෝ සතුන්ගේ සිත්තුල මෛත්‍රිය පැතිරේවා.....!**

# සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

## 2018 මැයි 29 අධි පොසොන් පොහෝ දින සිල් සමාදන් වීම සහ එක් දින අනේවාසික භාවනා වැඩසටහන

- අධි පොසොන් පොහෝ දින පැවැත්වෙන සිල් වැඩසටහන සහ එක් දින අනේවාසික භාවනා වැඩසටහන වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ දී පැවැත්වේ. ඒ සඳහා සහභාගී වීමට බලාපොරොත්තු වන්නේ නම් 2018 මැයි 27 වන දිනට ප්‍රථම කාර්යයාලයට දන්වන්න.

## 2018 ජුනි 3 මහියංගනය බුදු පිළිමය ඉදිකිරීමේ අවසන් අදියර ඇරඹීමේ සමාරම්භය සහ මෙත් සවිය 15 වන සංවත්සර මහ සමුළුව සහ මෛත්‍රී භූෂණ උපහාර උළෙල

- අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු බුද්ධශාසන අමාත්‍ය ජයවික්‍රම පෙරේරා මැතිඳුන්ගේ සහභාගීත්වයෙන්, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ දී (කොළඹ 05, තුන්මුල්ල හංදියේ පිහිටි) පස්වරු 1.00 සිට 5.00 දක්වා පැවැත්වෙන, මෙත් සවිය 15 වන මහා සමුළු උළෙල සහ මහියංගනයේ 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ ඉදිකිරීමේ අවසන් අදියර සමාරම්භය සහ මෛත්‍රී භූෂණ උපහාර උළෙල සඳහා ඔබ සැමගේ සහභාගීත්වය අපේක්ෂා කෙරේ. පැමිණීමට බලාපොරොත්තු වන්නේ නම් 2018 මැයි 30 වන දිනට පෙර කාර්යයාලයට දන්වන්න.

## 2018 ජුනි 17 වන දින 38 වන භාවනා වැඩසටහන අවසානය

- 38 වන භාවනා වැඩසටහන ජුනි මස 17 වන දින අවසන් වේ.

## 2018 ජුනි 24 වන දින 39 වන භාවනා වැඩසටහන ආරම්භය

- ඉරු දිනවල පස්වරු 2.00 සිට 5.00 දක්වා පැවැත්වෙන 39 වන ත්‍රෛමාසික භාවනා සහ චිත්ත සංයම අභ්‍යාස වැඩසටහන සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2018 ජුනි මස 15 වේ. සාමාජික අයදුම්පත අවසන් පිටුවේ ඇත.

## 2018 ජූලි 01 වන දින පළමු ඉරු දින වැඩසටහන ධම්මගවේසී බෞද්ධාශ්‍රම ශාලාවේ දී.

- ඉහත වැඩසටහන කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්මගවේසී බෞද්ධාශ්‍රම ශාලාවේ දී පැවැත්වේ. මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ ''ලෝක විෂය බුදු නෙතින් සහ විදු ඇසින්'' දේශනය එදින පැවැත්වේ.

## 2018 ජූලි 06 - 08 යන තෙදින තුළ අපවත් වී වදාල අතිපූජ්‍ය ආනන්ද නාහිමියන්ගේ තෙමස් සැමරුම

- 2018 ජූලි 06 වන දින රාත්‍රී 7.00 ට සුමධුර ධර්ම දේශනාවක් ද, 7 වන සෙනසුරාදා මහා සංඝරත්න විෂයයෙහි පවත්වන සාංඝික දක්ෂිණාවක් ද, 8 වන ඉරු දින අනෙකුත් දාන මාන ද වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ දී සිදු කෙරේ. සියලු දෙනාගේ පැමිණීම සහ දානමය ආධාර බලාපොරොත්තු වේ.

## 2018 ජූලි 15 වන ඉරු දින, 37 වන පංච අභිඥා පිළිබඳ වැඩමුළුව

- 37 වන පංච අභිඥා වැඩසටහන ජූලි 15 වන ඉරු දින ආරම්භ වේ.

### මුද්දර ආධාර

මුද්දර ගාස්තු වැඩි වී ඇති බැවින් සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග කිරීමට කැමති පින්වතුන් හට කැමති ප්‍රමාණයක මුද්දර කාර්යාලයට පරිත්‍යාග කරන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

### අසරණ සරණ සහ මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා පිංකැටවල එකතු කළ මුදල්

සතුන් නිදහස් කිරීම සඳහා පිං කැටවල එකතු කළ මුදල් භාරදීමට කැමති අය කාර්යාලයට එම මුදල් භාර දී පිං පත්‍රිකාවක් ලබා ගන්න.

### මීළඟ මෙත් සවිය සඟරාවේ පළ කිරීම සඳහා සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පළ කරනු ලබන දැන්වීම් භාර ගැනීම

මීළඟ මෙත් සවිය සඟරාවේ එළ කිරීම සඳහා ලබාදෙන සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ එළ කරනු ලබන දැන්වීම් 2018 - 08 - 31 දිනට පෙර සභාපතිතුමා වෙත හෝ කාර්යාලයට හෝ භාර දෙන්න.

### පුස්තකාලයෙන් ලබා ගත් පොත් නැවත ලබා දෙන්න

පුස්තකාලයෙන් ලබා ගත් පොත් නැවත ලබා දෙන මෙන් සියළුම සාමාජිකයින්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

### මෙත් සවිය හැඳුනුම්පත සහ සාමාජිකත්වය අළුත්කර ගැනීම

මෙත් සවිය හැඳුනුම්පත් මෙතෙක් ලබා නොගත් සාමාජිකයින් එම හැඳුනුම්පත් මෙත් සවිය කාර්යයාලයට පැමිණ ලබා ගන්න. තවද මෙත් සවිය රඳා පවතින්නේ ඔබගේ සාමාජික අරමුදල් මතය. එබැවින් සාමාජිකත්වය අළුත් කර නොගත් අය වෙත්නම් හැකි ඉක්මනින් සාමාජිකත්වය අළුත්කරගෙන අප සංසදයෙන් කෙරෙන සියළුම පුණ්‍යකටයුතු වල කොටස් කරුවකු වන්න.

### පුස්තකාලය නවීකරණය

නව පොත් සහ CD එකතුවක් සමගින් කියවීමේ පහසුකම් සහිතව නව පුස්තකාලය කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ පළමු මහලේ ස්ථාපනය කර ඇත.

# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ

# 14 වන සංවත්සර වාර්තාව

වර්ෂ 2017 ක් අප්‍රේල් මස 2 වන ඉරුදින පස්වරු 1.30 ට කොළඹ 7 බෞද්ධාලෝක මාවතේ ධර්මගවේෂී බෞද්ධාශ්‍රම ශාලාවේදී මෙත්සවිය සංසදයේ 14 වන මහ සමුළුව සහ මෛත්‍රී භූෂණ සම්මාන උළෙල උත්කර්ශවත් අයුරින් ඇරඹුණි. උත්සවයේ මුලසුන හෙබවීමට නියමිතව සිට බම්බලපිටිය ශ්‍රී වජිරාරාමාධිපති අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායේ මහා නායක රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති ත්‍රිකුණාමලයේ ආනන්ද මහානායක හිමිපාණන්ගේ ගෞරවනීය වැඩමකරවීම සිදුවිය. උත්සවයේ ප්‍රධාන අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අධිකරණ සහ බුද්ධශාසන අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතා සහභාගී වීමට නියමිතව තිබුනද නොවැලැක්විය හැකි හේතුවක් නිසා එතුමන්ට සහභාගී වීමට නොහැකිවිය. විශේෂ ආරාධනාවක් මත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු කුඩා කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් උත්වයට සපැමිණියේය.

ගරු අමාත්‍යතුමා සහ මෛත්‍රී භූෂණ ලාභී වෛද්‍යවරුන් ඇතුළු සම්භාවනීය ආරාධිත අමුත්තන් මෙත්සවිය සංසදයේ ගරු සභාපති නාලන්දා කීර්ති ශ්‍රී, ශාසනදීපන, විද්‍යාකීර්ති මහාචාර්ය චන්දන ජයරත්න මැතිඳුන් සහ සංසදයේ ගරු සමලේකම්වරුන් විසින් බුලත් හුරුළු පිළිගන්වා සාදරයෙන් පිළිගන්නා ලදී. ඉක්බිතිව සම්භාවනීය ආරාධිත අමුත්තන් විචිත්‍රවත් පෙරහැරකින් සභාගැබ වෙත කැඳවාගෙන එන ලදී.

අනතුරුව උත්සවයේ සමාරම්භය සනිටුවන් කරමින් පොල්තෙල් පහන දැල්වීමේ අවස්ථාව උදාවිය. ගරු අමාත්‍යතුමා, මෙත්සවිය ගරු සභාපති, සම්මාන ලාභී වෛද්‍යවරුන් ඇතුළු සම්භාවනීය අමුත්තන් විසින් පොල්තෙල් පහන දැල්වීම සිදුකරන ලදී. ඉක්බිතිව පැමිණ සිටි පිරිස මෙත්සවිය තේමාපාඨය තුන් වරක් ගායනා කිරීමෙන් අනතුරුව උත්සවයේ වැඩකටයුතු ආරම්භ කරන ලදී. ඉන්පසුව බම්බලපිටිය ශ්‍රී වජිරාරාමාධිපති අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායේ මහා නායක රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති ත්‍රිකුණාමලයේ ආනන්ද මහානායක හිමිපාණන් විසින් මුලසුන හොබවමින් සභාව ආජීවක අෂ්ඨමක ශීලයේ පිහිටවන ලදී. ඉන්පසුව මෙත්සවිය සංසදයේ ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිඳුන් විසින් පිළිගැනීමේ සටහන තබමින් මහා සංඝරත්නය ප්‍රමුඛ පැමිණි සිටි සම්භාවනීය අමුත්තන් ඇතුළු පැමිණි සිටි පිරිස පිළිගන්නා ලදී. මින් අනතුරුව හොරණ විදුසිළු රංගායතනයේ දරු දැරියන් විචිත්‍රවත් රංගනයක් ඉදිපත් කරන ලදී.

අනතුරුව මෛත්‍රී භූෂණ සම්මාන ප්‍රධානය කිරීමේ අවස්ථාව උදාවිය. මෙත් සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ඨ සේවය හා ප්‍රවීණතාවය උදෙසා පිරිනැමෙන මෛත්‍රී භූෂණ ගෞරව සම්මානය හෘද රෝග පිලිබඳ ආයුර්වේද විශේෂඥ වෛද්‍ය සරත් සෝමසිරි ගුණවර්ධන වෙද මහතා වෙත ගරු කුඩා කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මහතාගේ සුරතින් ප්‍රදානය කිරීමට යෙදිනි. දෙවනුව මෙත් සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ඨ සේවය හා ප්‍රවීණතාවය උදෙසා පිරිනැමෙන මෛත්‍රී භූෂණ ගෞරව සම්මානය දේශීය අක්ෂිවෛද්‍ය වෛද්‍ය ශිරෝමණි ලංකාපුත්‍ර පී. වීරසිංහ වෙද මහතා වෙත ගරු කුඩා කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මහතාගේ සුරතින් ප්‍රදානය කිරීමට යෙදිනි. අනතුරුව මෛත්‍රී භූෂණ සම්මානයෙන් පිදුම් ලැබූ වෛද්‍යවරුන් දෙපල මෙවැනි සම්මාන පිරිනැමීමේ වැදගත්කම පසක් කරමින් කෙටි දේශනයන් දෙකක් පවත්වන ලදී. අනතුරුව මෙත් සවියේ ගරු අනුශාසක අධිකරණ සංඝනායක අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමින්වහන්සේ විසින් සම්මාන ලාභී වෛද්‍යවරුන්ගෙන් සිදුවන සේවය පාදක කරගනිමින් අනුශාසනාවක් පවත්වන ලදී. ඉන්පසුව උත්සවයේ ප්‍රධාන අමුත්තා වූ කුඩා කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මැතිතුමන් විසින් ආයුර්වේද හා දේශීය වෙදකම් වල ඇති වටිනාකම සඳහන් කරමින් දේශනාවක් පවත්වන ලදී. පසුව හොරණ විදුසිළු රංගායතනය මඟින් විචිත්‍රවත් රංගනයක් ඉදිරිපත් කරන ලදී.

මෙත්සවිය සංසදයේ උන්නතිය උදෙසා තම ශ්‍රමය ධනය කාලය කැපකරමින් සුවිශේෂී වූ සේවාවන් ඉටුකරන ලද ඉංජිනේරු ප්‍රියන්ත පියදාස සහ විගණකවරුන් වන ප්‍රසංග පෙරේරා සහ කේ. ඒ. ඩී. පද්මසේන යන මහත්වරුන් මෙත්සවිය වෙනුවෙන් කරන ලද සේවාව අගයමින් විශේෂ ඇගයීමේ සම්මාන පිරිනැමීම මීලගට සිදුවිය. ස්වෙච්චාවෙන් ඉදිරිපත් වී තම සේවා කාලය තුල, තම ශ්‍රමය ධනය කාලය කැපකරමින් මෙත්සවියේ උන්නතිය වෙනුවෙන් කරන ලද සේවය ඇගයීම් පිණිස මෙත්සවිය කමිටු සාමාජිකයන් උපහාරයෙන් පිදීම මීලගට සිදුවිය.

ඉන්පසුව මුලසුන හොබවමින් වැඩවිසූ බම්බලපිටිය ශ්‍රී වජිරාරාමාධිපති අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායේ මහා නායක රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති ත්‍රිකුණාමලයේ ආනන්ද මහානායක හිමිපාණන් විසින් කෙටි ධර්මදේශනයක් පවත්වන ලදී. ඉක්බිතිව මෙත්සවිය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ශිෂ්‍යත්ව ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසකට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සිදුකරන ලදී. මෙත්සවිය ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිඳුන් සහ මෛත්‍රී භූෂණ සම්මාන ලාභී වෛද්‍යවරුන් විසින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සිදුකරන ලදී.

ඉන්පසුව මෙත්සවිය මාසික ධර්මදේශනාව පූජ්‍ය බොරැල්ලේ කෝවිද ස්වාමින්වහන්සේ විසින් පවත්වන ලදී. ධර්මදේශනාවෙන් අනතුරුව පැමිණි සිටි පිරිස වෙත තේ පැන් සංග්‍රහයක් පවත්වන ලදී. අනතුරුව මෙත්සවිය සංවත්සරයේ සහ මෛත්‍රී භූෂණ සම්මාන උළෙලේ කටයුතු නිමාවට පත්කරන ලදී.

## මෙත්සවිය 14 වෙනි මහ සමුළුවේ වාර්තාව

වර්ෂ 2017 ක් වූ අප්‍රේල් මස 02 වන ඉරුදින පසවරු 5.00 ට කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ, ධර්මගවේෂී බෞද්ධාශ්‍රම ශාලාවේදී, සංසදයේ ගරු පැවිදි අනුශාසක අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමින්වහන්සේගේ ද, මෙත්සවිය නිර්මාතෘ සහ සංසදයේ ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේද ප්‍රධානත්වයෙන් ආරම්භ විය. සංසදයේ ගරු සමලේකම් චින්තක බණ්ඩාර මහතා මෙත්සවිය 14 වන සමුළුවේ සමාරම්භක සටහන තබමින් සමුළුවේ කටයුතු ආරම්භ කරන ලදී.

පළමුව 13 වන මහසමුළුවේ වාර්තාව මෙත්සවිය සංසදයේ ගරු සමලේකම් කෝසල එදිරිසිංහ මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. එම වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙසට පී.පී. පෙරේරා මහතා යෝජනා කළ අතර පී. පී. තිලකසිරි මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී. ඉන්පසුව මෙත්සවිය 2016/2017 වර්ෂ තුල සිදුකෙරුණු ක්‍රියාකාරකම් පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් ගරු සමලේකම් චින්තක බණ්ඩාර මහතා විසින් සභාවට ඉදිරිපත් කළ අතර එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ජගත් ප්‍රසන්න මහතාගේ යෝජනාවෙන් හා වික්‍රම ගුණදාස මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් පිළිගනු ලැබින. අනුතුරුව මෙත්සවිය සංසදයේ ගරු උප භාණ්ඩාගාරික සුරංග ලියනගේ මහතා විසින් 2016 වර්ෂය සඳහා වූ විගණනය කරන ලද අයවැය වාර්තාව ඉදිරිපත් කිරීමට යෙදුනි. ඉදිරිපත්කල අයවැය වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ප්‍රදීප් යහම්පත් මහතාගේ යෝජනාවෙන් හා අතුල නානායක්කාර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

අනතුරුව මෙත්සවිය ව්‍යවස්ථානුකූලව මෙත්සවිය සංසදයේ සභාපති තුමා ඇතුළු නිලධාරි මණ්ඩලය දරන තනතුරු වලින් ඉල්ලා අස්විය. ඉදිරි වසර සඳහා මෙත්සවිය සංසදයේ සභාපති ලෙස මහාචාර්ය චන්දන ජයරත්න මහතා තෝරාපත්කර ගන්නා ලදී. තවද උපසභාපතිවරුන් ලෙස වෛද්‍ය චන්දිම මාරසිංහ මහතා හා චින්තක බණ්ඩාර මහතාද, සමලේකම් තනතුරු සඳහා මංජුල පද්මකුමාර මහතා සහ කෝසල එදිරිසිංහ මහතාද, භාණ්ඩාගාරික ලෙස චමින්ද ඉන්දික මහතා ද, උප භාණ්ඩාගාරික ලෙස සුරංග ලියනගේ මහතාද, සංස්කාරක ලෙස එම්. කේ. ප්‍රියන්ත මහතා ද තෝරා පත් කරගන්නා ලදී. කාරක සභික වරුන් ලෙස මෙනුර ඩයස්, දර්ශන ගලප්පත්ති, මාලන් කන්දගේ, ජගත් ප්‍රසන්න, මහේන්ද්‍ර ජයනාත්, චේනුක ජයසූරිය යන මහත්වරුන් තෝරාපත් කරගන්නා ලදී. තවද වෙබ් කමිටු සභාපති ලෙස දක්ෂිණ උදයංග මහතාද, බුදුපිළිම ක්‍රියාකාරී කමිටුවේ සභාපති ලෙස පී. පී. පෙරේරා මහතාද, කාන්තා කමිටුවේ සභාපතිනිය ලෙස රංජනී උඩුගොඩ මහත්මියද, තරුණ කමිටුවේ සභාපති ලෙස උචිත ජයතිස්ස මහතාද, අසරණ සරණ කමිටුවේ සභාපතිනිය ලෙස එන්. එම්. බී. දහනායක මහත්මියද, සුවසෙත කමිටුවේ සභාපති ලෙස අතුල නානායක්කාර මහතාද, නීති උපදෙස් කමිටුවේ සභාපති ලෙස නීතිඥ චන්දන ජයතිස්ස මහතාද, දාන සිල භාවනා කමිටුවේ සභාපති ලෙස පියල් චන්ද්‍රතුංග මහතාද තෝරාපත්කර ගන්නා ලදී.

නිලධාරි මණ්ඩලය තෝරා පත්කරගැනිමෙන් අනතුරුව මෙත්සවිය සංසදයේ සමාගම් ලේකම් ලෙස හිටපු සමාගම් ලේකම් වන රොබට් හේවගේ මහතා ද විගණනකරුවන් ලෙසට පෙරසිටි විගණනකරුවන් වන MKJ Associates (වරලත් ගණකාධිකාරිවරු) නැවතත් 2017/2018 වර්ෂය සදහා තෝරාපත්කරගැනීමට සුරංග ලියනගේ මහතා යෝජනා කරන ලදී. අනතුරුව, අප්‍රේල් 1 සිට මාර්තු 31 ලෙස පැවති මෙත්සවිය සංසදයේ ගිණුම් වර්ෂය ජනවාරි 1 සිට දෙසැම්බර් 31 ලෙස ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට යෝජනා විය. එම යෝජනාව සභාවේ ඒකමතික තීරණයෙන් ස්ථිරවිය. මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් ස්තුති කතාව කරමින් සංවත්සර උළෙල සාර්ථක කරගැනීමට උදව් කළ විවිධ පාර්ශවයන්ට විශේෂ ස්තුතිය පුද කරන ලදී. මීළඟ මාසික රැස්වීම අප්‍රේල් 09 වන ඉරුදින පස්වරු 1.00 ට වැල්ලවත්ත ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ දී පැවැත්වීමට යෝජනා කරමින් මහ සමුළුවේ වැඩ කටයුතු නිමාවට පත් කරන ලදී.

මෙත්සවිය
සුභසාධක කමිටුව

## සාමාජිකයින්ට අතහිත දීම පිණිස මෙත් සවිය සුභසාධක කමිටුව ආරම්භ කළ වගයි...

මෙත් සවිය සාමාජිකත්වයේ සුභසාධනය වෙනුවෙන් ම කටයුතු කරන්නා වූ දැනට අඩුපාඩුවක් ව පැවති ඉහත කී කමිටුව ආරම්භ කෙරුන අතර මෙත් සවිය නිර්මාතෘවරයාගේ පූර්ණ අධීක්ෂණයෙන් හා මෙහෙයවීම මත පහත සඳහන් ප්‍රතිලාභ සාමාජිකත්වය වෙත පිරිනැමෙන බව සතුටින් දන්වා සිටිමු.

- සාමාජිකයන්ගේ පෞද්ගලික දැවෙන ජීවන ගැටලු වල දී නන් අයුරින් අතහිත දීම.
- පවුලේ අවමඟුල් කටයුත්තක දී සංග්‍රහ කටයුතු සඳහා නෙස්කැෆේ යන්ත්‍රයක් සහ රු. 1000 ක් දක්වා කිරි කෝපි, වතුර ෆිල්ටර නොමිලයේ පිරිනැමීම. අනාගතයේ දී හට් එකක් ද වීදුරු පිඟන් කෝප්ප ද ලබා දීමට බලාපොරොත්තු වේ.
- අවමංගල්‍ය කටයුතු වලදී රැළි පාලම් සහ සුදු කොඩි ප්‍රදර්ශනය කරවීම.
- උත්සව අවස්ථාවලදී ජල බෝතල් සහ පිඟන් භාජන සැපයීම හා සහභාගීත්වයෙන් සහය පල කිරීම.
- දේශන, ධර්ම සාකච්ඡා සහ කොළඹ රෝහල්වල බෙහෙත් ගැනීම / ප්‍රතිකාර සඳහා දුරබැහැර සිට පැමිණෙන සාමාජිකයින් වෙත කොළඹ තාවකාලික රාත්‍රී නවාතැන් පහසුකම් සැපයීම.

### පහත සඳහන් ද්‍රව්‍ය මෙත් සවියට සපයා දී මේ සඳහා ආධාර උපකාර කිරීමට කැමති පිංවතුන් කුසල් රැස්කර ගනිත්වා!

- වතුර ෆිල්ටර (water dispenser)
- වීදුරු ● පිඟන් ● හැඳි ● පැන් වඩන කට්ටල
- සුදු කොඩි ● පාලම් කොඩි ● කොඩි කණු ආදිය සහ
- ඇඳන්, කොට්ට, මෙට්ට...

### සියලු විමසීම් සඳහා පහත සඳහන් දුරකථන අංක අමතන්න...

මෙත් සවිය : 071 40 144 67 / 011 2 50 5088

සභාපති : ධර්මසිංහ වික්‍රමආරච්චි මහතා - 071 14 94 031

ලේකම් : එන්. ජයවීර මහතා - 072 27 20 429

**තංච කම්මං කතං සාධු - යං කත්වා නානු තප්පති**
**යස්ස පතීතෝ සුමනෝ - විපාකං පටි සේවතී**

''යම් ක්‍රියාවක් කිරීමෙන් අනතුරුව පසු තැවිලි වන්නට සිදු නොවන ප්‍රීතිමත්ව සොම්නස් සිත් යුතුව විපාක විඳින්නට සිදුවන ක්‍රියාවන් කිරීමට මැනවි...'' ධම්ම පදය

**මෙම මහගු පුණ්‍යකර්මය සචල කරගැනීම සඳහා රු.85,000 ක් පමණ වටිනා නෙස්කැෆේ යන්ත්‍රයක් මෙත්සවියට පරිත්‍යාග කළ, ජර්මනියේ පදිංචි වෛද්‍ය සඳමාලි ගෝමස් මහත්මියට සියළු කටයුතු සචල වේවා!' යි ආශිර්වාද කරන්නෙමු.**

## පසළොස් වන සංවත්සර සැමරුම සහ මෛත්‍රී භූෂණ උපහාර උළෙලේ දී සමාජ උන්නතිය උදෙසා කළ මෙහෙවර වෙනුවෙන් උපහාරයට පාත්‍ර වන වගයි...

## 2018 ජුනි 03 වන ඉරු දින කොළඹ 05, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවතේ, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ දී මහත් උත්සවශ්‍රීයෙන් පැවැත් වෙන වගයි ..!

සිද්ධි රස්තු





**මෙත් සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ඨ සේවය හා ප්‍රවීනතාවය උදෙසා පිරිනැමෙන උපහාර සම්මානයයි.**

**'දුල්ලභෝ පුරිසාජඤ්ඤො' යන බුදු වදන තුළින්, ලොව්තුරා අමා මෑණි බුදු පියාණන් වහන්සේ අපට උගන්වා වදාළේ දුර්ලභ උත්තම පුරුෂයා උපන් රටත්, ගමත් බබළන බවයි.**

රාජ්‍ය වර්ෂ 1938 ජනවාරි මස 12 වනි දින, මීට අසූ වසරකට පෙර උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව ප්‍රාදේශීය බල ප්‍රදේශයේ, මහඇලගම දී උපත ලබා, මීට 57 වසරකට පෙර සියම් මහා නිකායේ, අස්ගිරි පාර්ශ්වයේ භික්ෂුවක ලෙස සසුන් ගත වී සසුන් කෙත සරු කරමින් ද විවිධ රෝගාබාධයන්ගෙන් පීඩා විඳි දෙස් විදෙස් ගිහි පැවිදි අය සුබි සුවපත් කිරීම සඳහා රාජ්‍ය වර්ෂ 1972 දී හෙළ වෙදකම අරඹමින් මහඇල, වෛද්‍ය පරම්පරාවේ වෛද්‍යවරයෙකු ලෙස සර්ප විෂ, මානසික රෝග, පිළිකා, අංග බාග, ස්නායු ආබාධ ඇතුළු සර්වාංග රෝග නිවාරණ වෛද්‍යවරයෙකු ලෙස පුරා 46 වසරක් වෛද්‍ය වෘත්තියේ නියැලෙමින් රෝගීන් දස දහස් ගණනකට සුව සෙත සැලසූ.

**රද්දොළුගම, කුස්වල ශ්‍රී පුෂ්පාරාම මහා විහාරාධිපති,**
**දේශීය වෛද්‍ය විශාරද ශාසන කීර්ති ශ්‍රී විද්‍යාපති**

**පූජ්‍යපාද මහඇලගම ලංකානන්ද ස්වාමීන්ද්‍රයන්වහන්සේ වෙත**

මෛත්‍රී භූෂණ **වෛද්‍ය චක්‍රවර්ති ගෞරව සම්මානය**

සිරි බුද්ධ වර්ෂ 2562 ක් වූ අධි පොසොන් මස අව විසේනිය නම් තිථිය ලත් රවි දින හෙවත්
රාජ්‍ය වර්ෂ 2018 ජුනි 03 වන ඉරු දින
කොළඹ 05, සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ දී
ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන
මෙත් සවිය 15 වන සංවත්සරික මහ සමුළු උළෙලෙහි දී හරසරින් පිරිනමනු ලබන වගයි.

සිද්ධි රස්තු



**මෙත් සිත් පෙරදැරි ජාතික මෙහෙවර, විශිෂ්ඨ සේවය හා ප්‍රවීනතාවය උදෙසා පිරිනැමෙන උපහාර සම්මානයයි.**

**"දුල්ලභෝ පුරිසාජඤ්ඤො" යන බුදු වදන තුළින්, ලොව්තුරා අමා මෑණී බුදු පියාණන් වහන්සේ අපට උගන්වා වදාළේ දුර්ලභ උත්තම පුරුෂයා උපන් රටත්, ගමත් බබළන බවයි.**

රාවණා පරපුරේ හිරු ජ්‍යෝතිෂයත්, අධ්‍යාත්මික මෙන්ම ඉපැරණි වෛද්‍ය විද්‍යාවත් මුසුව ලෝකයේ පැරණිම රෝග විනිශ්චය වූ සූර්ය නාඩි, තත්කාල ආශ්‍රයෙන් රෝගියාගේ කේන්ද්‍රය ඇසුරු කර ගනමින් රෝග විනිශ්චයත්, රස ගුණ වීර්ය විපාක ප්‍රභව ගුණ පිණිසත් තත්වාබෝධයෙන් සැකසුණු මෙම සුවිශේෂී වෛද්‍ය ක්‍රමය තුළින් සුවහසක් රෝගීන්ට සුව සෙත සැළසූ.

ලක් දීපය බැබළවා වූ සිව් සැට කලාවෙන් සපිරි මහේශාක්‍ය රාවණා පරපුරේ කෘතහස්ථ වෙද පරම්පරාවෙන් පුණරාගමනය වූ ලක්දිවට ජනසෙත උදාකළා වූ, සියනෑ කෝරළය නිජබිම කරගත් මාරසිංහ වෙද පරම්පරාවේ සර්වාංග රෝග නිවාරණයෙන් ඔබ්බට ගිය

**යක්කල, අළුගම්ගොඩ, සුවාශ්‍රමයේ,**

**දේශීය වෛද්‍යශූරී රුවින්ද මාරසිංහ මැතිඳුන් වෙත**

මෛත්‍රී භූෂණ **වෛද්‍ය ශිරෝමණී ගෞරව සම්මානය**

සිරි බුද්ධ වර්ෂ 2562 ක් වූ අධි පොසොන් මස අව විසේනිය නම් තිථිය ලත් රවි දින හෙවත්
රාජ්‍ය වර්ෂ 2018 ජුනි 03 වන ඉරු දින
කොළඹ 05, සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ දී
ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන
මෙත් සවිය 15 වන සංවත්සරික මහ සමුළු උළෙලෙහි දී හරසරින් පිරිනමනු ලබන වගයි.

# න්‍යාය පත්‍රය

**පස්වරු**

01.00 සාමාජිකයින්ගේ ලියාපදිංචිය සහ ආරාධිත අමුත්තන්ගේ පැමිණීම.

01.30 ගරුතර මහා සංඝරත්නය වැඩම කරවීම.

01.35 ප්‍රධාන ආරාධිත අමුත්තා වන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති **මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,** ගරු බුද්ධ ශාසන අමාත්‍ය **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා** සහ පොලිස්පති **පූජිත ජයසුන්දර** මහතා ඇතුළු විශේෂ ආරාධිත අමුත්තන් සහ මෛත්‍රී භූෂණ සම්මානලාභීන් කැඳවාගෙන පැමිණීමේ පෙරහැර.

01.40 සාම්ප්‍රදායික පොල්තෙල් පහන දැල්වීම.

01.45 මුලසුන හෙබවීම, සමස්ථ ලංකා අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහා නායක **අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස නාහිමිපාණන් වහන්සේ.**

01.50 මල් පහන් පුදා ආජීව අෂ්ඨමක සීලය සමාදන් වීම සහ මෙත් සවිය තේමා පාඨය කියවීම.

02.00 පිළිගැනීමේ කථාව : මෙත් සවිය ගරු සභාපති, විද්‍යාකීර්ති **මහාචාර්ය චන්දන ජයරත්න මහතා**

02.10 මෙත්සවිය අනුශාසක : ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත, **පූජ්‍යපාද රණස්ගල්ලේ ඤාණවීර ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ** අනුශාසනාව.

02.20 ප්‍රාසාංගික අංගය.

02.25 2600 සම්බුද්ධ ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ ඉදිකිරීමේ අවසන් අදියර සමාරම්භය සනිටුහන් කරමින් **අතිගරු ජනාධිපතිතුමාට**, ශ්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශවයේ අතිපූජ්‍ය **වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී ඤාණරතනාභිධාන** මහානායක මාහිමිපාණන් වහන්සේ වෙත සහ මහියංගන රාජමහා විහාරාධිපති **උරුළෑවත්තේ ධම්ම රක්ඛිත හිමිපාණන්** වෙත බුදු පිළිමයේ අනුරුවක් බැගින් ප්‍රදානය කිරීම, මුල් අදියරෙහි ප්‍රධාන ඉංජිනේරු **මහාචාර්ය තිෂාන් ජයසිංහ මහතාගේ** සේවය ඇගයීම.

02.30 අතිගරු ජනාධිපතිතුමාගේ දේශනය.

**මෛත්‍රී භූෂණ සම්මාන සහ විශේෂ ගෞරව සම්මාන පිරිනැමීම**

02.45 **පූජ්‍යපාද මහඇලගම ලංකානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ** මෛත්‍රී භූෂණ උපහාර සම්මානය වෙනුවෙන් හේතුපාඨ කියවීම හා සම්මානය පිරිනැමීම.

02.50 **පාරම්පරික දේශීය වෛද්‍ය එම්. පී. රුවින්ද මාරසිංහ** වෙදමහතාගේ මෛත්‍රී භූෂණ උපහාර සම්මානය වෙනුවෙන් හේතුපාඨ කියවීම හා සම්මානය පිරිනැමීම.

02.55 ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කළ **ගිහි පිංවතුන්** උදෙසා පිරිනමන විශේෂ ගෞරව සම්මානය වෙනුවෙන් හේතුපාඨ කියවීම හා **පොලිස්පති පූජිත ජයසුන්දර** මහතාවෙත විශේෂ ගෞරව සම්මානය පිරිනැමීම.

03.00 ප්‍රාසාංගික අංගය.

03.10 මෛත්‍රී භූෂණ උපහාරලාභීන් සහ විශේෂ සම්මාන ලාභීන් විසින් පවත්වනු ලබන කෙටි දේශන.

03.25 මෙත් සවිය පසළොස් වසරක ප්‍රගතිය සමාලෝචනය.

03.35 ප්‍රාසාංගික අංගය.

03.40 පාසැල් සිසුන් සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව 50 ක් ප්‍රදානය, තම කාලය, ධනය, ශ්‍රමය වැය කර මෙත්සවියේ උන්නතියට උර දුන් කමිටු සාමාජිකයන් ඇගයීම, වසර 15 ක් නොකඩවා සාමාජිකත්වය පවත්වා ගත් සමාජිකයින් ඇගයීම සහ නායකත්ව පුහුණු පාඨමාලාව සාර්ථකව නිමාකළ කමිටු සාමාජිකයින් සඳහා සහතික පත්‍ර ප්‍රදානය කිරීම.

3.55 විශේෂ ඇගයීම් (ඇස් කන්නාඩි හා ශ්‍රවනාධාර උපකරණ ලබාදීමට දායකත්වය දුන් පිංවතුන් සහ නායකත්ව පුහුණුවට සම්පත් දායකත්වය ලබාදුන් පිරිස).

4.00 **ගරු බුද්ධ ශාසන අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා** මැතිතුමාගේ දේශනය.

4.10 මුලසුනේ දෙසුම.

4.20 තේ පැන් සංග්‍රහය.

4.30 **වාර්ෂික මහ සමුළුව**


- න්‍යාය පත්‍රය කියවීම,
- පසුගිය වාර්ෂික මහ සමුළුවේ වාර්තාව ඉදිරිපත් කිරීම,
- වාර්ෂික ප්‍රගති වාර්තාව හා අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම.
- ඉදිරි වර්ෂය සඳහා නිළධාරී මණ්ඩලය සහ විගණකවරු පත් කිරීම

4.50 ස්තූති කතාව.

4.55 ජාතික ගීය වාදනය කිරීම.

5.00 සමාප්තිය.

2018 මාර්තු 04 වන දින කොළඹ, බොරැල්ල තරුණ බෞද්ධ සංගම් (Y.M.B.A) ශාලාවෙහි පැවැත් වූ,



# 2018 සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත්වන ක්‍රම පිළිබඳ වැඩමුළුව




























**අධ්‍යාපන වැඩමුළුව සඳහා පාසල් සිසු සිසුවියන් ඇතුළු සාමාජිකයින් 750 කට අධික ප්‍රමාණයක් සහභාගී වන ලදී.**

**අසරණ සරණ කමිටුව විසින් මෙත්සවිය පුස්තකාලය, මෙත්සවිය සාමාජික ඔබ වෙනුවෙන් නැවත විවෘත කල වගයි.** අක්‍රිය තත්වයේ පැවතුන මෙත්සවිය පුස්තකාලය ආචාර්යතුමන් විසින් අසරණ සරණ කමිටුවට පවරා එය සක්‍රිය කර එලදායී ලෙස පවත්වාගෙන යාමට උපදෙස් ලබාදුනි. ඒ අනුව අප කමිටුව දින 10 වැනි කෙටි කාලයක් තුල දී පොත් සියල්ල ප්‍රතිසංවිධානය කර, කර්තෘ අනුව පිළිවෙලට ඇසුරුම් කර, එම පිළිවෙලටම පොත් පරිඝනක ගත කර, ඊට සමගාමීව ලේඛන ගත කිරීම ද සිදුවිය. 2017/12/17 දින ආචාර්යතුමන්ගේ පින්බර සුරතින් පුස්තකාලය නැවත විවෘත විය. පුස්තකාලය සතුව පුස්තක 2000 කට ආසන්න ප්‍රමාණයක් ඇති බව ද සතුටින් දන්වා සිටිමු.

(පුස්තකාලය භාරකාරිනී සහ අසරණ සරණ කමිටුවට සභාපතිනි.)





# සඳහම් චාරිකාව

# මහියංගනය



දාන - ශීල - භාවනා වැඩසටහන සඳහා 2017 ඔක්තෝම්බර් මස 1 වන දින මෙත්සවිය සාමජික සාමාජිකාවන් සහභාගීවෙමින්...











මෙත්සවිය සාමාජික සාමාජිකාවන් විසින් මහියංගනය චෛත්‍යරාජයාණන් වහන්සේට කංචුක පූජාව පැවැත්වීම...









අධ්‍යාපන දක්ෂතා ඇති ළමුන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම, ජල පිරිපහදු යන්ත්‍ර හා උපකරණ පරිත්‍යාග කිරීමේ අවස්ථා කිහිපයක්...







2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ අධීක්ෂණය සහ ඒ අභියස භාවනාවේ යෙදෙමින්...



# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

## වර්ෂ 2017 / 2018

## කමිටු සාමාජික සාමාජිකාවන්



**ඉදිරිපෙළ වමේ සිට දකුණට -** සුභාෂිණී සේනාධීර මහත්මිය / එන්.අයි.එස්. ජයවීර මහත්මිය / ඩී.එස්.එස්.ආර්. ගමගේ මහත්මිය / හේමන්ති පෙරේරා මහත්මිය / අශෝකා ජයතිලක මහත්මිය / ඩී. කුසුම් දහනායක මහත්මිය / ජී. විජේතුංග මහත්මිය / ඒ. තලතා චාන්දනී ද සොයිසා මහත්මිය / ශාන්ති ඉලංගසිංහ මහත්මිය / සෝමා දීගල්ල මහත්මිය

**දෙවන පෙළ වමේ සිට දකුණට -** එන්. දහනායක මහත්මිය / පියල් චන්ද්‍රතුංග මහතා / පී.පී. පෙරේරා මහතා / මෙනුර ඩයස් මහතා / චේතුක ජයනාත් මහතා / මංජුල පද්මකුමාර රණසිංහ මහතා / එච්.එම්. චින්තක යුරාජ් බණ්ඩාර මහතා / **මෙත් සවිය සභාපති :** ශාසන දීපන, විද්‍යා කීර්ති, මහාචාර්ය චන්දන ජයරත්න මහතා / **මෙත් සවිය ගරු පැවිදි අනුශාසක :** අමරපුර නිකායේ අධිකරණ සංඝනායක අතිපූජ්‍ය අහංගම ආනන්ද ස්වාමීන් වහන්සේ / චන්දිම මාරසිංහ මහතා / අසංක කෝසල එදිරිසිංහ මහතා / එම්. කේ. ප්‍රියන්ත මහතා / පී.පී. ජගත් ප්‍රසන්න මහතා / උචිත ජයතිස්ස මහතා / චන්දන ජයතිස්ස මහතා / රංජනී උඩුගොඩ මහත්මිය

**තෙවන පෙළ වමේ සිට දකුණට -** ශ්‍යාමා පෙත්තාවඩු මහත්මිය / දිස්නා සමරසිංහ මහත්මිය / හේලිඅමා සෙනරත් මහත්මිය / මියුරියෙල් පෙරේරා මහත්මිය / මිල්ඩා සී. පෙරේරා මහත්මිය / සන්ධ්‍යා ජයතුංග මහත්මිය / ධනංජනා ඉලංගසිංහ මහත්මිය / ---- / ඊශා ප්‍රනාන්දු මහත්මිය / සඳමාලී ජයසිංහ මහත්මිය / මුදිතා වික්‍රමසිංහ මහත්මිය / ශ්‍යාමා සමරධීර මහත්මිය / දිලුක්ෂි මධූෂා රංගනී මහත්මිය / මොනිකා දමයන්ති මහත්මිය / රෝහිණී විජේසිංහ මහත්මිය / රමණී කුරුප්පු මහත්මිය / බිනෙරත් රේචන් ජයතිස්ස මහත්මිය / උදිතා ජයතිස්ස මහත්මිය / තමරා සමරවීර මහත්මිය / කේ.ආර්.පී. දූල්වල මහත්මිය

**සිව්වන පෙළ වමේ සිට දකුණට -** චමින්ද ඉන්දික මහතා / පර්සි අභයරත්න මහතා / එම්.එච්. ඉන්දික මහතා / නන්දසේන ජයවීර මහතා / නිහාල් ජී පුංචිහේන මහතා / ජී.ජී. තිලකසිරි මහතා / සුපුන් ඒකනායක මහතා / ---- / නාලක ප්‍රියදර්ශන මහතා / ප්‍රදීප් යහම්පත් මහතා / ඒ.ජන්.පී. මෙන්ඩිස් මහතා / වික්‍රම ගුණදාස මහතා / එම්.එච්. ලක්ෂ්මන් මහතා / මංජුල හොරව්ල මහතා / බන්දුල පද්මකුමාර මහතා / ඩී.සී.ජී.එස්. පත්මතිලක මහතා / ශිරාන් බමුණුසිංහ මහතා / ඩබ්.එස්.ඩබ්.පී. විතාන මහතා / යූ.ඒ. ප්‍රේමලාල් මහතා / ඩබ්.ඩී.සී. පෙරේරා මහතා

මෙත් සවිය ● 2018 මැයි ● 14 වන කාණ්ඩය ● 32 වන කලාපය

15 සංවත්සරය

# මෙත් සවිය අසරණ සරණ කමිටුව

**2017 වර්ෂයට අදාල අසරණ සරණ කමිටුවේ ක්‍රියාකාරී කටයුතු සහ අසරණ සරණ තක්ෂිලාවේ සරසවි වරම් ලද දූ පුතුනටත්, දැයේ දරුවන්ටත් ප්‍රදානිත ශිෂ්‍යත්ව.**

## ක්‍රියාකාරී කටයුතු,

2017 අප්‍රියෙල් 02 වැනි දින පවත්වන ලද 14 වැනි සංවත්සර උළෙලේ දී ශිෂ්‍යත්වලාභීන් 30 කට ආසන්න පිරිසක් කැඳවන ලදී. එහි දී ඔවුනු වෙනුවෙන් පහත සඳහන් දෑ ප්‍රදානය කරන ලදී.

පැමිණි සෑම ශිෂ්‍යත්ව ලාභියකු සඳහා පොත් බෑගයක් සමඟ පාසැල් උපකරණ සහ ගමන් වියදම් ප්‍රදානය කරන ලදී.

වෛද්‍ය පීඨ සිසුවියන් දෙදෙනෙක් සඳහා වෙදනලා (Stethoscope) 02ක් ලබා දුනි.

ශිෂ්‍යත්වලාභී දියණියක් අ.පො.ස. සා.පෙ) විශිෂ්ඨ සාමාර්ථ 09 ක් ලබා සිය හෘදයංගම කෘතවේදී ස්තූති කථාවක් සභාව අමතා කරන ලදී. එහිදී අප ආචාර්ය චන්දන මැතිඳුන්ගේ මැතිනිය විසින් මලලසේකර ශබ්දකෝෂයක් පරිත්‍යාග කරන ලදී.

★ 2014 වර්ෂයේ සිට ශිෂ්‍යත්ව ලාභීන් සඳහා පරිහරනය වූ ලිපිගොනු කවර මේවනවිට අබලන්ව තිබූ බැවින් මෙත්සවිය සාමාජික නිලන්ත මහතාගේ රු. 5,000 ක ධන පරිත්‍යාගයෙන් සහ අප සාමාජික සාමාජිකාවන්ගේ ස්වේච්ඡා දායකත්වයෙන් දිගුකාලීනව පරිහරනය කලහැකි ලිපිගොනු කවර 50ක් (තොග මිල එකක් රු. 140.00) මිලදී ගන්නා ලදී. ක්‍රියාකාරී සියළුම ලිපි ගොනු කාණ්ඩ තුනකට වෙන්කර (සිසු, දානපති, ගිණුම්) නව ලිපිගොනු වලට අනුගතකර, ඉතාමත් පහසුවෙන් ලිපි ගොනුවක් ලබා ගත හැකි අයුරින් පිළියෙල කරන ලදී. ඒ සඳහා කමිටු සාමාජිකයින්ගේ නොමසුරු ශ්‍රම දායකත්වය ලද බව සතුටින් ප්‍රකාශකර සිටිමු.

★ 2017 මැයි මස අවසන් ඉරු දින මෙත් සවිය භාවනා වැඩසටහනට සහභාගි වූ පිංවතුන් සඳහා තේ පැන් සංග්‍රය අප කමිටු දායකත්වයෙන් සිදු විය.

★ 2017 අගෝස්තු මස පෝය වැඩසටහනේ හීල් දානය සඳහා දානමය ද්‍රව්‍ය සහ ශ්‍රම දායකත්වය ලබාදුනි.

★ 37 වන සහ 38 වන නව සාමාජික කණ්ඩායම බඳවා ගන්නා දින ඔවුන් අපහසුතාවයට පත්වීම වැලකීම සඳහා ප්‍රධාන කමිටුවෙන් කවුන්ටර් සේවයක් පටන් ගැනුණි. එම සේවාව සඳහා අසරණ සරණ කමිටු සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වය ලබා දෙන ලදී.

★ 2017 සැප්තැම්බර් මස 17 දින පැවති අක්ෂි සායනයට අවශ්‍ය පරීක්ෂණ කටයුතු සඳහා සහ සායනයට පැමිණි අයට ලබා දුන් තේ පැන් සංග්‍රහ සඳහා මුදලින් කොටසකට දායකත්වය ලබාදුනි.

★ අසරණ සරණ කමිටු වේ දායකත්වයෙන් 2017 නොවැම්බර් මස පලමු ඉරු දින ධර්ම දේශනාව ධම්මගවේශී බෞද්ධ මධ්‍යස්ථානයේ දී පැවැත්වූයේ, කැළණිය විශ්ව විද්‍යාලයේ පාලි හා සංස්කෘතික අංශයේ මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන ස්වාමීන්වහන්සේ විසිනි. එම ධර්ම දේශනාව ආචාර්යතුමාගේ ද ඇගයීමට ලක් වූ අතර සැමගේ දම් පිපාසාවට දිය දෝතක් ද විය. තව ද එම ධර්ම දේශනාව අසරණ සරණ කමිටු සාමාජික මහත්මීන් කිහිප දෙනෙකුගේ දායකත්වයෙන් ඩී. වී. ඩී. පටයකට ඇතුලත්කර 38 කණ්ඩායමට ධර්ම දානයක් ලෙස ප්‍රදානය කරන ලදී.

★ මෙත්සවිය පුස්ථකාලය අක්‍රිය තත්වයෙ පැවතුන බැවින් එහි ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාමටත්, පුස්තකාලයේ භාරකාරත්වයත්, අසරණ සරණ කමිටුවට ආචාර්යතුමන් විසින් පවරන ලදී. අප කෙරෙහි විශ්වාසයෙන් පැවරූ කාර්යභාරය අප කමිටුවට දින 10 ඇතුලත ඉටු කර ගත හැකි විය. පොත් සියල්ල ප්‍රතිසංවිධානය කර කර්තෘ අනුව පිළිවෙලට ඇසුරුම් කර පොත් එම පිළිවෙලටම පරිඝනක ගත කරන ලදී. 2017.12.17 දින නැවත විවෘත වූ පුස්ථකාලය මෙත්සවිය සාමාජිකයන් ගේ ඇසුරට පත්කිරීමට හැකි විය. පොත් සියල්ල පරිඝණක ගත කිරීමට සමගාමීව ලේඛන ගත කිරීම ද සිදු විය.

2018 ජනවාරි 1 වැනිදා පෝය දින ගංගාරාම විහාරස්ථානයේ පැවති හීල්දානමය පිංකම සඳහා ද්‍රව්‍යමය සහ ශ්‍රම දායකත්වයද, වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ දාන ශීල වැඩ සටහනේ දී අපගේ ශ්‍රම දායකත්වය බැති සිතින් ලබා දුනි. ආචාර්යතුමන්ගේ උපදේශකත්වය සහ මගපෙන්වීම මත අප කමිටුවේ මැදිහත්වීමෙන් නාය යාමෙන් නිවාස විනාශ වී ගිය පවුලකට නව නිවසක් සාදා දීමට දැනට කටයුතු ආරම්භ කර ඇත.

ඒ සඳහා චමින්ද මහතා ගේ ප්‍රධාන දායකත්වය ලැබී ඇති අතර දායක වීමට කැමති පිංවතුන් සිටී නම් අසරණ සරණ සභාපතිනියට දැනුම්දෙන ලෙස මෙත් සිතින් දන්වා සිටිමු.

★ අප කමිටුවේ දානපතීන් සහ ශිෂ්‍යත්වලාභීන්ගේ සංඛ්‍යාව වැඩි වී ඇති බව සතුටින් දන්වා සිටිමු.

## ශිෂ්‍යත්ව පරිපාලන කටයුතු,

★ ශිෂ්‍යත්ව අයදුම්පතක් ලද පසු එය පරීක්ෂාකර, ශිෂ්‍යත්වය ඉදිරිපත්කර ඇති පාර්ශවයන්ගේ (ස්වාමීන්වහන්සේ, මෙත් සවිය සාමාජික, සඟරාවෙන්)තහවුරුව මඟින් සෑහීමට පත්විය හැකි නම්, එම අයදුම්පත් අනුමැතිය සඳහා ආචාර්යතුමාට යොමුකරනු ලැබේ.

★ ශිෂ්‍යත්ව ප්‍රදානකල පසු ඔවුන්ගේ ප්‍රගතිවාර්තා සහ වියදම් වාර්තා ලබා ගැනීමට අවශ්‍ය ආකෘති පත්‍ර යවා ලිපි මඟින් ඔවුන් දැනුවත් කෙරෙති. නියමිත කාලයට ප්‍රගති වාර්තා නොලැබේ නම් සිහිකැඳවීම් ලිපි මගින් ඔවුන් දැනුවත් කර ඒවා ලබාගන්නා අතර දිගුකාලීනව ප්‍රගති වාර්තා නොඑවන්නේ නම් ශිෂ්‍යත්වය තාවකාලිව නතර කරනු ලැබේ.

★ ප්‍රගති වාර්තා ලද පසු ඒවායේ ඡායා පිටපත් අදාල ශිෂ්‍යත්ව ප්‍රදානිතයාට යවනු ලැබේ.

★ දානපතියන් ගෙන් මාසිකව හෝ ත්‍රෛමාසිකව හෝ වාර්ෂිකව ශිෂ්‍යත්ව වාරික මුදල් ලබාගැනීමට කටයුතු කරන අතර ප්‍රමාද දෝෂයකින් හෝ කලට වේලාවට මුදල් නොලැබේ නම් ඔවුනට සිහිකැඳවීම් කරනු ලැබේ.

ශිෂ්‍යත්වය අයදුම් කිරීමේ දී වැරදි, අසත්‍ය තොරතුරු සැපවුවහොත් ශිෂ්‍යත්වය අවලංගුවේ. අධ්‍යාපනයට නොවන වියදම් දැරීමෙන් ද ශිෂ්‍යත්වය අවලංගු වේ.

## ගිණුම් කටයුතු,

ආචාර්යතුමන්ගේ අනුමැතියෙන් යුතු, ප්‍රගති වාර්තා කලට වේලාවට ලැබී ඇති,ශිෂ්‍යත්ව සඳහා නාමලේඛනය සකසා මුදල් යැවීම සඳහා බැංකු වවුචරපත් (50ට ආසන්න) සම්පූර්ණ කර නාමලේඛනය සමඟ තුලනය කර, පරිපාලන නිලධාරි තුමාට බාර දෙනු ලැබේ.

මුදල් බැංකු ගතකළ පසු වවුචර පිටපත් අදාල සිසුන්ගේ ලිපිගොනු වලට ඇතුලත් කරන අතර මේ සඳහා පවත්වාගෙන යනු ලබන ලෙජරයට ද සටහන් කෙරේ. ලෙජරයට සමඟාමීව සිසුවාගේ ලිපි ගොනුව ද තුලනය විය යුතුවේ.

පොරොන්දු වූ කාල සීමාව අවසන් වූ දානපතියන් වෙනුවට නව දානපතියන් අනුයක්ත කල යුතු වේ. සෙනසුරාදා දිනයන්හි ගිනුම් කටයුතු සිදු කරලීමට සිය කාලය ශ්‍රමය ධනය වැයකර පැමිණෙන සාමාජිකයිනට ආශීර්වාදාත්මක ප්‍රණාමය හිමිවේ.

## පරිෂනක කටයුතු,

පසු ගිය මාස දෙකක පමණ කාලය තුල දී 2014 සිට 2017 වසර දක්වා ප්‍රදානය කරන ලද ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යත්වලාභීන් පිළිබඳවත්, ශිෂ්‍යත්ව ප්‍රදානිතයන් ගැනත් තොරතුරු පරිඝනක ගත කර ඇත. ලිපි ගොනු පරීක්ෂාවකින් තොරව අවශ්‍ය තොරතුරු මෙ මඟින් ලබා ගත හැක.

ශිෂ්‍යත්ව ප්‍රදානිතයන්ගේ නොපියවුම්, සිසුන් ගේ ප්‍රගති වාර්තා නො ලැබීම්, මාසිකව ශිෂ්‍යත්ව මුදල් ලැබීම්, සතුන් නිදහස් කිරීමට ඇති ලැබීම්, කැට වලින් ලැබීම් පිළිබඳ මාසික වාර්තා පරිඝනකය හරහා ලබා ගත හැක.

මෙත් සිත් පෙරදැරිව ආචාර්යතුමන් කරන සද්කාර්යයන් අතරින් අසරණයන්ට පිහිටවීමේ කාර්යභාරයේ දී අප සාමාජික මහත්ම මහත්මීන්ට ලද මෙම මහගු අවස්ථාව ප්‍රයෝජනයට ගෙන ධර්ම මාර්ගයට අවතීර්න වීමට අවශ්‍ය ශක්තිය ධෛර්ය ලැබේවා.!

**අසරණ සරණ කමිටු සභාපතනී.**

## තුති කුසුම්



**පහත වැඩසටහන් සඳහා
ආධාර පරිත්‍යාග ලබා දුන් සුපින්වතුන් හට
මේ කරගත්තා වූ කුසලය නිවන් දක්නා ජාති දක්වා ම
ඔබ පසුපස එන සෙවනැල්ල සේ පවතීවායි ප්‍රාර්ථනා කරන්නෙමු !**

### 2017/10/08 සිට 2018/02/25 තෙක් මෙත් සවිය භාවනා වැඩසටහනට සහභාගීවන්නන් හට තේ පැන් සහ කෙටි ආහාරමය සංග්‍රහය සඳහා දායකත්වය දැරූ සුපිංවතුන්

2017/10/15 : මධුර වන්නිආරච්චි
ශ්‍යාමා විතානවසම්
උපුලි අමරසිංහ
පුෂ්පා, ජීවන්ති චන්දිමා ආරියපාල.
පද්මසිරි වන්නිආරච්චි මිය

2017/10/22 : සුරේෂනී දේවිකා

2017/11/26 : චන්දිමා කලුවාවිල
හේමා සේනානායක
චන්දිමා කටුවැල්ල
ජේ. එච්. ආර්. පී. ජයවර්ධන
ජේ. එම්. සිරිවර්ධන
නයනි ප්‍රනාන්දු
සුජීවා රාමනායක

2017/12/10 : රන්ජිත් ප්‍රේමලාල්
අනෝමා සරත්කුමාර
එම්. ඩී. ලීලකාන්ති
ඕ. ඒ. චායා දිප්නි බන්දු
කේ. ඒ. නදී

2017/12/17 : ධම්මිකා ඉඹුලාන
මේනකා ඉලුක්කුඹුර
ඒනුක වීරසේකර
ස්වර්ණමාලී
ගුණපාල රත්නායක
දිනිති

2018/01/14 : චින්තක මහතා

2018/01/21 : පද්මකුමාර ජයසිංහ මිය
සකුන්තලා ගුණසේකර මිය

2018/01/28 : ගයනි ගමගේ

2018/02/11 : ස්වර්ණා වර්ණකුලසූරිය
අනුලා විජේසූරිය
කේ. ඩී. විමලසේන
ප්‍රියානි මුණසිංහ
සීතාද සිල්වා

2018/02/25 : අනෝමා සරත් කුමාර
නිරංජී, පංචමී
මධුෂානි, චෙත්මා
වාසනා, කෞෂානි
රජීව, ගුණසේකර මහතා
සමන්තා සමරකෝන්





# ඓතිහාසික මහියංගන රාජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙළීම සඳහා 2017. 09. 18 සිට 2018. 01. 31 දක්වා ආධාර කළ පිංවතුන්ගේ නාම ලේඛනය

## (ගිණුම් අංකය : 000560001118 - සම්පත් බැංකුව - කිරිබත්ගොඩ ශාඛාව)

| ටිකට් පත් අංකය | නම | සා: අං | මුදල රු. |
|---|---|---|---|
| KETA-591 | පරිත්‍යාග | | 110 |
| 14/A-30538 - 30539 | පරිත්‍යාග | | 200 |
| KETA-589 | එස්.අමරසිංහ මිය | | 300 |
| 14/C-0735 | කරුණාවතී මුණසිංහ මිය | | 500 |
| 14/C-0736 | චාමලී කඩුගල්ල මිය | | 500 |
| 14/C-0494 | ලාල් ගමනායක මයා | | 500 |
| 14/C-0737 | අයි.ජේ.අයි.යු.කේ.ගුණරත්න මයා | 32-4964 | 500 |
| රුපියල් 500 ටිකට් 01 | මෙත්සවිය කමිටු සාමාජිකයන් මහියංගන රාජ මහා විහාරයේදී | | 500 |
| 14/C-738 | පි.කේ.බී.පරනපාල මිය | 37-3779 | 500 |
| රු. 250 ටිකට් 03 | මෙත්සවිය කමිටු සාමාජිකයන් මහියංගන රාජ මහා විහාරයේදී | | 750 |
| 14/D-345 | ඩබ්.ඒ.කුසුමාවතී මිය | | 1,000 |
| 14/C-0326-0327 | මහියංගනය සදහම් චාරිකාවේ දී ලද පරිත්‍යාග | | 1,000 |
| 14/D-0357 | සෝමලතා ජයසිංහ මිය | | 1,000 |
| 14/D-348 | මොනිකා දමයන්ති මිය | | 1,000 |
| 14/D-349 | තුෂාරි දේවින්දි රාජපක්ෂ මිය | | 1,000 |
| 14/D-066 | දයා චන්ද්‍රවංස | | 1,000 |
| 14/D-067 | සජීව චන්ද්‍රවංස මයා | | 1,000 |
| 14/D-221 | මොරීන් දහනායක මිය | | 1,000 |
| 14/D-0222 | ඕ.ජ්.ඩී.බණ්ඩාර මයා | | 1,000 |
| 14/D-0223 | ඩී.ජ්.චන්ද්‍රිකා පද්මසිලි මිය | 25-3843 | 1,000 |
| 14/D-0224 | අයි.ඩී.කේ.මල්ලිකා මිය | 34-5252 | 1,000 |
| 14/D-227 | අසෝක කරුණාරත්න මයා | | 1,000 |
| 14/D-0226 | වොල්වින් වීරසිරි ද සිල්වා මයා | | 1,000 |
| 14/D-225 | රසිකා වර්වුසල් මිය | | 1,000 |
| රු. 1000 ටිකට් 01 | මෙත්සවිය කමිටු සාමාජිකයන් මහියංගන රාජ මහා විහාරයේදී | | 1,000 |
| 14/D-081 | විජායි ජයසිංහ මිය | | 1,000 |
| 14/D-0360 | ලසන්ත පෙරේරා මයා | 14-2415 | 1,000 |
| 14/D-068 | ලසන්ත පෙරේරා මයා | 14-2415 | 1,000 |
| 14/D-082 | සුමනා ප්‍රේමරත්න මිය | 36-2258 | 1,000 |
| 14/D-346-347 | කරුණාවතී මුණසිංහ මිය | | 2,000 |
| 14/D-0350/065 | චන්ද්‍රසිරි ලියනාරච්චි මයා | 23-3528 | 2,000 |
| රු. 500 ටිකට් 04 | මෙත්සවිය කමිටු සාමාජිකයන් මහියංගන රාජ මහා විහාරයේදී | | 2,000 |
| 14/D-0358-0359 | පි.කේ.බී.පරනපාල මිය | 37-3779 | 2,000 |
| KETA-593 | මෙත්සවිය කමිටු සාමාජිකයන් මහියංගන රාජ මහා විහාරයේදී | | 2,400 |
| 14/A-25576-23600 | පූර්ණ ප්‍රදීප් මයා | 35-5411 | 2,500 |
| 14/A-26076-26100 | ශී.එස්.කන්දගේ මිය | 36-5596 | 2,500 |
But there is no convincing evidence to show using plastic bottles or plastic containers increases the risk of cancer.

### *What research has been done?*

Most of the concerns about plastic bottles and containers focus on whether chemicals inside the plastic can move out into food or drink. And if the levels of these chemicals could do us any harm.

### *Can chemicals in plastic move into food and drink?*

Some studies have shown that small amounts of chemicals from plastic containers can end up in the food or drinks that are kept inside them. But the levels of these are very low.

The level of chemicals in food or drink can depend on things like how the container is treated. For example plastic water bottles in experiments have often been heated to high temperatures, sometimes for a long time. And even in experiments where plastic bottles are heated to temperatures as high as 60°C for many hours, levels of chemicals that move into food are drink are usually far under levels that are considered unsafe.

These experiments are very different from everyday use, so it is likely that levels of chemicals in food or drink would be far below the levels that could be harmful.

Some of these chemicals have been referred to as 'endocrine disrupting' chemicals. This means they can affect how hormones work. Some people have suggested that chemicals in plastic can affect our hormone levels, and that this can cause cancer. But there is no good evidence that this is true.

## *What chemicals are allowed in plastics?*

In the UK there is very strict regulation about plastics and other materials that are used for food or drink. This is to make sure that chemicals can't move out of plastics and into food and drink at high levels that could be harmful.

There are strict safety limits set in the UK that manufacturers have to stick to. And products are tested to make sure they are in line with regulations.

## *Can I microwave food in plastic containers or covered in cling film?*

Let's cover the original misinformation first: The earliest missives warned that microwaved plastic releases cancer-causing chemicals called dioxins into food. The problem with that warning is that plastics don't contain dioxins. They are created when garbage, plastics, metals, wood, and other materials are burned. As long as you don't burn your food in a microwave, you aren't exposing yourself to dioxins.

When food is wrapped in plastic or placed in a plastic container and microwaved, BPA and phthalates may leak into the food. Any migration is likely to be greater with fatty foods such as meats and cheeses than with other foods. Old, scratched, or cracked containers, or those that have been microwaved many times, may leach out more plasticizers.

There is no good scientific evidence that microwaving food in plastic containers or wrapped in cling film can affect the risk of cancer.

You can use most cling film and plastics in the microwave, just make sure you use them as the instructions say.

In any case it is better to use plastic containers specially designed to use in microwaves which display a microwave-safe icon or transfer food to glass or ceramic containers labeled for use in microwave ovens. (Don't let plastic wrap touch food during microwaving because it may melt).Better not to use microwave plastic storage bags or plastic bags from the grocery store. Before microwaving food, be sure to vent the container: leave the lid ajar, or lift the edge of the cover. If you'd like more information about cooking safely in the microwave, look at Johns Hopkins University recommendations or the US Food Safety Inspection Service website.

**HOAX EMAILS AND MYTHS,** There are many hoax emails and unreliable internet articles warning about the so-called dangers of plastic bottles, containers and films. The emails generally warn people about reusing plastic bottles, freezing water in them or leaving them in hot cars. Some of them also talk about microwaving food in plastic containers or covered with plastic films.

However, there is no convincing scientific evidence to back up these claims or to suggest that any of these products could cause cancer.

**BISPHENOL A (BPA),** There have been lots of articles talking about the safety of BPA in plastics. But there is no good evidence that BPA can cause cancer in people. The European Food Safety Authority also did a full scientific review of BPA and concluded there was no health risk.

**DIOXINS,** Some hoax emails have circulated claiming that reusing, heating or freezing water bottles releases cancer-causing chemicals called dioxins. Some also mention a chemical called DEHA, a chemical found in plastics that the emails claim could potentially cause cancer.

Some of these emails credit the warnings about plastics to Johns Hopkins University in America, but the university denies any involvement(link is external). On their website, they say:

"The Internet is flooded with messages warning against freezing water in plastic bottles or cooking with plastics in the microwave oven. These messages, frequently titled "Johns Hopkins Cancer News" or "Johns Hopkins Cancer Update," are falsely attributed to Johns Hopkins and we do not endorse their content."

Professor Rolf Halden of Johns Hopkins' Bloomberg School of Public Health has said that freezing actually works against the release of chemicals. Halden stressed that people should not be afraid of drinking water because of "miniscule amounts of chemical contaminants present in [their] water supply."

Other versions of the emails say that the claims are endorsed by the Walter Reed Army Medical Center. Again, this is not true.

---

**Source 1: W. Australian Cancer Council,:**
*https://www.cancerwa.asn.au/resources/cancermyths/plastics-food-storage-myth/*

**Source 2: Harvard Medical School:**
*https://www.health.harvard.edu/staying-healthy/microwaving-food-in-plastic-dangerous-or-not*

**Source 3: Cancer research, UK:**
*http://www.cancerresearchuk.org/about-cancer/causes-of cancer/cancer-controversies/plastic-bottles-and-cling-film*

# පිරිතේ ධ්වනි ගුණය

අපි නිතර පිරිත් ශ්‍රවණය කරමු. ගුවන් විදුලියෙන් ද, රූපවාහිනියෙන් ද පිරිත් අසන්නෙමු. බුදු දහමේ ඇති දේ පරම සත්‍ය ම බව නියම බෞද්ධයෝ දනිති. එහෙත් අද තරුණ සමහරු, මෙකල භාෂාව වශයෙන් ගැනෙන නවීන විද්‍යාව මගින් යමක් පෙන්වා නුදුන්නහොත්, එය පිළිගැනීමට තරමක් අදි මදි කරති. තවමත් ළදරු අවදියේ පවත්නා නවීන විද්‍යාව මගින් අද ලොව සිදුවන සියලු දේ පැහැදිලි කළ නොහැකිය. එහෙත් එසේ විදු ඇසට හසුවන කොටසක්ද තිබේ. මේ ලිපියෙහි විග්‍රහ වන්නේ පිරිතේ තිබිය හැකි විවිධාකාර වූ ගුණ අතර එම ධ්වනි හෙවත් ශබ්ද ගුණය පිළිබඳ මෑතක දී කළ විද්‍යාත්මක පර්යේෂණයක ප්‍රතිඵලයකි.

වචනවල කිසිදු තේරුමක් නැතිව පිරිත් සජ්ඣායනයට සවන් දීමෙන් පමණක් ශරීරයත් මනසත් සංසුන් වන බව හෘද ස්පන්දන වේගය අඩු වී ලෙඩ රෝග සුව වීම දක්වා එය බලපාන අන්දම මෙහි දී විස්තර වෙයි. පිරිතේ හඬෙහි ගුණ ලබා ගැනීමට නම් එය ඉතා වේගයෙන් හෝ හිමින් නොකියා මධ්‍යම වේගයකින් කිව යුතු බවද පටිගත කළ හෝ ගුවන් විදුලියෙන් විකාශනය වන පිරිතක හඬට වඩා ඉතා විශාල ගුණයක් සංඝයා වහන්සේ හෝ ගිහියකු හෝ තම මුඛයෙන් ඒ වේලාවේ දේශනා කරන පිරිත් හඬෙහි ඇති බව ද මෙහි දී පෙන්වා දෙයි.

මෙම පර්යේෂණය කඳුබොඩ දෙල්ගොඩ ජාත්‍යන්තර භාවනා මධ්‍යස්ථානයේ දී එහි භාවනා කම්මට්ඨානචාර්ය ගරු මඩවල උපාලි ස්වාමීන්ද්‍රයන් වහන්සේ සමඟ නවීන විද්‍යාත්මක උපකරණ හා පරිගණක භාවිතයෙන් ඉටු කළ පර්යේෂණයක් බව ද මෙහි ලා විශේෂයෙන් ම සඳහන් කළ යුතුය.

### රෝග නිවාරණය සඳහා පිරිත්වලින් ලැබෙන සෙත

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ විවිධ පිරිත් සූත්‍ර බොහොමයක් අතුරෙන් දෙවැනි බණ වරෙහි එන සූත්‍ර පහක් විශේෂයෙන් ම රෝග සඳහා ම දේශනා කළ ඒවා වෙයි. ගිරිමානන්ද සූත්‍රය (දැඩි ගිලන් භාවයට පත් ගිරිමානන්ද තෙරුන් වහන්සේ මෙහි එන දශ සංඥාවන් අසා සුවපත් වී ඇත), මහ කස්සපත්ථෙර බොජ්ඣංගය (පිප්ඵලි නම් ගුහාවෙහි දැඩි ලෙස ගිලන් ව විසූ මහා කාශ්‍යප තෙරුන් වහන්සේ සප්ත බොජ්ඣංග ධර්ම ශ්‍රවණයෙන් සුවපත් වී ඇත). මහා මොග්ගල්ලාන බොජ්ඣංගය (ගිජ්ඣකූළ පව් වෙහෙරේ, ඉවසිය නොහැකි වේදනාවෙන් ගිලන්ව වැඩ හිටි මහ මුගලන් තෙරුන් වහන්සේ මින් සුවපත් වී ඇත.) හා මහා චුන්දථේර බොජ්ඣංගය ද මීට උදාහරණ කිහිපයකි. බොහෝ විට පිරිත්වල අර්ථය මෙනෙහි කිරීමෙන්ද රෝග සුව වූ බව මෙහි සඳහන් වේ.

### අපට ඇසෙන ශබ්දය යනු කුමක්ද?

මෙම පර්යේෂණයේ එන කරුණු අවබෝධ කර ගැනීමට නම් ශබ්දය පිළිබඳ විග්‍රහ කිරීමේදී භාවිත වන විද්‍යාත්මක නිර්වචන කිහිපයක් පිළිබඳව මූලික දැනුමක් පළමුව ලබා ගත යුතුය. අන්වායාම තරංග හා තීර්යක් තරංග වශයෙන් තරංග වර්ග දෙකකි. ආලෝකය ඇතුළු විද්‍යුත් චුම්භක තරංග ගමන් කරනුයේ තීර්යක් තරංග වශයෙනි. ශබ්දය ගමන් කරන්නේ අන්වායාම තරංග වශයෙනි. ශබ්දය ගමන් කිරීම සඳහා මාධ්‍යයක් (උදා:- වායුගෝලය) අවශ්‍ය අතර මාධ්‍යයේ අංශු තරංගය ගමන් කරන දිශාවට හා ඊට විරුද්ධ දිශාවට කම්පනය වී සම්පීඩන හා විරලන ඇති කරමින් තරංගය ඉදිරියට යයි.




**රූපය 1 : කම්පනය වන වස්තුවක් නිසා අසල ඇති වායු අනු කම්පනය වී තරංගය කන දක්වා ගමන් කරන අන්දම**


මෙම ශබ්ද තරංග ඉතා සංවේදී මයික්‍රෝෆෝනයක් හරහා විද්‍යුත් සංඥාවකට හරවා බැලීමේ දී පහත 2 රූපයේ d වලින් දක්වා ඇති ආකාරයේ සංකීර්ණ තීර්යක් තරංගයක් ඔසිලස්කෝපයක් හෝ පරිගණකයක් මත ලබා ගත හැකිය. එම සංකීර්ණ තරංගය a, b හා c මගින් දක්වා ඇති සුමට, සරල තීර්යක් තරංග කිහිපයක එකතුවකි. තත්පරයකට ඇතිවන කම්පන ගණන සංඛ්‍යාතය වශයෙන් හඳුන්වන අතර එය හර්ට්ස් (Hz) වලින් මනිනු ලැබේ.

තරංගයක උස - **විස්ථාරය** (Amplitude) වශයෙන් ද එක් කම්පනයකදී තරංගය ගමන් කරන දුර (හෝ උච්ච ස්ථාන දෙකක් අතර ඇති දුර) **තරංග ආයාමය** (Wave Length) වශයෙන් ද හඳුන්වනු ලැබේ. වේගයෙන් ගසන ලද සරසුලක් හෙමින් ගසන ලද සරසුලකට වඩා (සංඛ්‍යාතය එකම වුවද) අධික විපුලතාවකින් යුත් ස්වරයක් දෙයි.

සාමාන්‍ය සංගීතයේ ස්වර හතක් ඇති අතර ඒ ඒ ස්වර සඳහා ලැබෙන තරංග ස්වරූපය එකිනෙකට වෙනස් වේ. දැනට ලෝකයේ වෙනත් රටවල කර ඇති පර්යේෂණවලින් සොයාගෙන ඇති පරිදි සමහර පුද්ගලයන් ගේ කටහඬට බොහෝ දෙනෙකු වශී වන්නේ කට හඬෙහි දක්නට ඇති එතරම් සංකීර්ණ නොවූ සුමට තරංග ස්වභාවයයි.

පිරිත් සජ්ඣායනයේ දි සහ සංගීත වාදනයේ දි එන සංකීර්ණ ශබ්ද තරංග විශ්ලේෂණ කිරීම සඳහා මෙම පර්යේෂණයේ දි ශබ්ද අධ්‍යයනය සඳහා ඇමෙරිකාවේ නිපදවා ඇති කූල් එඩිට් (Cool Edit) හා බෑන්ඩ් ඉන් - අ - බොක්ස් (Band – in – a – Box ) පරිගණක මෘදුකාංග හා පරිගණකයට සම්බන්ධ කිරීමට ඉහළ ගුණාත්මක අගයකින් යුත් මයික්‍රෆෝනයක් යොදා ගන්නා ලදී.

මෙහි දි පිරිත් හා සංගීතය අතර විශාල වෙනසක් දක්නට ලැබිණි. සංගීතය ස්වර 7 කින් හා උච්ච ස්වර හා මන්ද ස්වර 7 කට විහිදී ගිය ද පිරිත ස්වර 4 කට පමණක් සීමා විය.




**රූපය 2**
මයික්‍රෆෝනයක් මඟින් ලබා ගන්නා කට හඬ ඉතා සංකීර්ණ තරංගයක් වන අතර (d) එය සරල තරංග කීපයක (a,b හා c) එකතුවකි

පිරිත් ශ්‍රවණයේ දී සංගිත ශ්‍රවණයේදී මෙන් රාගික හැගීම් ඇති නොවෙන්නට එක් ප්‍රධාන හේතුවක් මෙය වේ. එහෙයින් පිරිත්වලින් කළ හැකි දේ සංගිත ශ්‍රවණයෙන් කළ නොහැකි බව දැන් ඔබට පැහැදිලි වනු ඇත.

විවිධ සංගිත තාලවලට විවිධ පුද්ගලයන් කැමැත්ත දක්වන්නේ මන් දැයි විද්‍යාඥයන් සොයා බලා ඇත. සමහර පුද්ගලයන් රොක් සංගීත වැනි වේග රිද්මවලට කැමැති වන අතර තවත් සමහරු අඩු රිද්ම සහිත සම්භාව්‍ය (Classical) සංගීතයට රුචි කරති. මෙය ඔබද අත්දැක ඇතිවාට නිසැකය. මෙසේ එක්තරා රිද්මයක් සහිත සංගීතයකට පමණක් එක් පුද්ගලයකු රුචිකත්වයක් දක්වන්නේ එම සංගීත රාවයේ රිද්මය ඔහු ගේ හෘද ස්පන්දන සංඛ්‍යාතයට හෝ එහි ගුණාකාරවලට සමාන වු විට බව දැන් සොයා ගෙන ඇත.

එනම් හෘද ස්පන්දන සංඛ්‍යාතය සාමාන්‍යයෙන් වැඩි අය රොක් සංගීතය හා බයිලා වැනි අධි රිද්ම සංගීතවලට කැමැති වන අතර හෘද ස්පන්දනය අඩු සන්සුන් අය සම්භාව්‍ය සංගීතයට ප්‍රිය කරති.

බොහෝ අය ගේ හෘදය ස්පන්දන වේගයට සමාන ඩ්‍රම් හඬ ඇසුණු විට ඉබේ නැටවෙන ස්වරූපය ඇතිවෙන්නේ එබැවිනි. මේ අනුව යමින් විවිධ රිද්මයන් ගෙන් යුත් බාහිර සංගීතයයොදා ගනිමින් සමහර මානසික රෝගවලට ප්‍රතිකාර කරන සංගීත ප්‍රතිකාර ක්‍රමය නම් ක්‍රමයක් ද හඳුන්වා දී ඇත.


බාහිර ශබ්දය ඇසෙන්නට සලස්වා එමඟින් එහි රිද්මය ක්‍රමයෙන් අඩු කිරීම මඟින් මානසික පීඩනයට ලක් වු මිනිසකු තැන්පත් බවට පත් කිරීමට සංගීතය යොදා ගත්ත ද ඊට වඩා බෙහෙවින් බලවත් ලෙස පිරිත් ශ්‍රවණය කිරීමෙන් මිනිසකු ගේ සිත සහ කය සංයමයට පත්වන බව අප කළ පර්යේෂණවල දී හෙළි විය.

ස්වර 7 ක් සහිත සංගීතයේ දී මෙන් ස්වර 4 ක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් සහිත පිරිත්වල දි යටපත් වී ඇති රාගික හැගිම් මතු නොවීමද මෙහි දි වැදගත් කොට සැලකිය යුතුය.


මෙම පර්යේෂණයේ දී එයට සහභාගි වු තැනැත්තන් හට සාමාන්‍ය සංගීතය ඇසෙන්නට සලස්වා හෘදය වස්තුවේ සිදුවන කම්පනය පරිගණක තිරය මත ලබා ගත් අතර එහි දී හෘදය කම්පනය වන වේගයෙහි හා විස්තාරයෙහි අඩුවක් විනාඩි 30 කට පසුව වත් දක්නට නොලැබිණි.

ඉන් පසුව ගරු ස්වාමින් වහන්සේ විසින් දේශිත පිරිත් සජ්ඣායනයකට සවන් දීමට ඔවුන් යොමු කළ අතර අප පුදුමයට පත් කරමින් පිරිත් ශ්‍රවණය අරඹා විනාඩි 10 ක් යෑමටත් මත්තෙන් ඔවුන්ගේ හෘද කම්පනයෙහි වේගය සහ තිව්‍රතාව විශාල ලෙස අඩුවනු දක්නට ලැබිණි.

**රූපය 3 සහ 4 බලන්න.**



**රූපය 3**
සාමාන්‍ය අවස්ථාවක දී හෘද ස්පන්දනය පරිගණකය මඟින් මනින අන්දම.



**රූපය 4**
පිරිත් ශ්‍රවණය අරඹා විනාඩි 10 ක් යෑමට පෙර පුද්ගලයකුගේ හෘදය කම්පනය වන වේගය හා එහි විස්තාරය අඩු වෙන අන්දම දක්වන

**පරිගණක ශබ්ද විශ්ලේෂන සටහන්**

භාවනාවෙහි යෙදී සිටින පුද්ගලයකු තුළ ද මෙවැනිම වු හෘද ස්පන්දන වේගය අඩු වීමක් හා මනස සන්සුන් වීමක් භාවනාව අරඹා විනාඩි කිහිපයක් තුළ දක්නට ලැබෙන අතර ඉන් පෙනී යන්නේ රෝග සුව වීම සඳහා භාවනාව මඟින් ලැබෙන ප්‍රතිඵල ම පිරිත් ශ්‍රවණය කෙරෙන් ද ලබා ගත හැකි බවය.

බටහිර විද්‍යාඥයින් දැනට සොයාගෙන ඇති පරිදි භාවනා කිරීමේ දී ශරීරයේ ඇති කෝටිසෝල් නම් රසායනිකයේ සාන්ද්‍රණය අඩු වීම නිසා රෝගවලට ඔරොත්තු දීමේ ප්‍රතිශක්තිය හෙවත් ශ්වේතානු සතු හැකියාව වැඩි වේ. එහෙයින් සෙම්ප්‍රතිශ්‍යාව වැනි රෝග පමණක් නොව, අනෙකුත් බෝවන රෝග ඒවා නිතර භාවනාවෙහි යෙදෙන පුද්ගලයන් හට අඩු බවත් පැහැදිලි වේ. මීට අමතරව රුධිර පීඩනය අඩු වීම, රුධිරයේ කොලොස්ටරෝල් මට්ටම පහළ බැසීම, නින්ද නොයන අයට ඇදට ගිය විගසින් නින්දට යෑම, දියවැඩියාව අඩුවීම, මානසික පීඩන, ක්ලමත (Stress) කාංසාත්මක තත්ව (Anxiety) විෂාදය වැනි මානසික රෝග පවා භාවනා කරන විට අඩු වන බව ද දැන් සොයා ගෙන ඇත.

එහෙයින් බුදුරජාණන් වහන්සේ රෝග නිවාරණය සඳහා පිරිත් දේශනා කර තිබේ. මෙහි විද්‍යාත්මක පසුබිමක් ඇති බව දැන් අපට මොනවට පැහැදිලි වේ. විශේෂයෙන්ම ගිහි පින්වතුන් බොහෝ වේලාවක් භාවනාවෙහි නොයෙදුණත් පැය කිහිපයක් පිරිත් ශ්‍රවණය සඳහා සහභාගි වන විට එමඟින් ලැබෙන මානසික සුවය හරහා බොහෝ ශාරීරික රෝග මෙන් ම මානසික රෝග ද සුව විය හැකිය. අද බොහෝ විට සර්ව රාත්‍රික පිරිත් දේශනා තරුණයන් විසින් සංවිධානය කරනු ලැබුවද රාත්‍රී 11.00 පමණ පසු වූ විට නැවත අලුයම දක්වා ආවතේව කරූ හැර පිරිත් ශ්‍රවණය කිරීමට වෙනත් කිසිවෙකු බොහෝ විට දක්නට නොලැබීම කනගාටුවට කරුණකි.

සර්ව රාත්‍රික පිරිත් දේශනාවේ දී අවසානය දක්වා පිරිත් ශ්‍රවණය කරන රෝගීන් ගේ රෝග සුව වූ හෝ අඩු වූ බව වාර්තා වී ඇති අතර ඒ පිළිබඳ අත්දැකීම් ඇතොත් ඒවා අපට වාර්තා කිරීම මේ පර්යේෂණය අවසන් කර ගැනීම සඳහා මහත් පිටිවහලක් වනු ඇත.

## පිරිත් කියන විට වේගයෙන් කියවිය යුතු ද, සෙමින් කිව යුතු ද?


අප ගේ මීළඟ පර්යේෂණය වූයේ හුස්ම හෙළන්නේ නැති තරම් වේගයෙන් පිරිත් කියාගෙන කියාගෙනයන්ට සැලැස්වීම, මධ්‍යම වේගයෙන් පිරිත් සජ්ඣායනය කිරීම සහ ඉතාම තාලයකට ඇද අඩු වේගයෙන් පිරිත් සජ්ඣායනය කරන විට දී ඉන් ලැබෙන ධ්වනි ගුණය මෙම පරිගණක ශබ්ද විශ්ලේෂණ මෘදුකාංගය භාවිත කර විශ්ලේෂණය කිරීමයි. මෙහි දී ලබා ගත් සටහන් පිටුවෙහි ඉඩකඩ මදි නිසා ඉදිරිපත් නොකළ ද, සංක්ෂිප්තයක් වශයෙන් ගත් කළ එහි දී සොයා ගත් දේ නිතර පිරිත් කියන බෞද්ධයන් කා හටත් ඉතා වැදගත් වනු ඇත.

පිරිත ඉතා අධික වේගයෙන් කීමේ දි හා ඉතා සෙමින් ඇද පැද කීමේ දි ට වඩා මධ්‍යම වේගයෙන් පිරිත් කියන විට එහි දි ඇතිවන තරංග රටා ඉතා ම සෞම්‍ය අයුරින් ඇතිවන බව පෙනේ. මීට අමතර ව සිතෙහි ඒකාග්‍රතාවකින් තොර ව නොසැලකිල්ලෙන් පිරිත් කියන විට ද ඇති වූ තරංග සෞම්‍ය නොවූ විෂමාකාර වූ ඒවා බව දැක ගත හැකිය.

**රූපය 5 න්,** හෘද ස්පන්දන වේගය අඩු කර සිත සන්සුන් කිරීම සඳහා බෙහෙවින් ම බලපානුයේ ඝෝෂාකාරී ශබ්ද, අධි වේගයෙන් හෝ ඉතා සෙමින් ඇද කියන පිරිත් නොව, මධ්‍යම වේගයෙන් කියන පිරිත් බව ද දැක ගත හැකි විය. පිරිතේ විවිධ ගුණ වේගයෙන් හා සෙමින් කියන විට ලබා ගැනීමට තිබුණ ද අප මෙහි දි ප්‍රකාශ කරනුයේ පිරිතෙහි ශබ්දය හෙවත් හඬින් ලැබෙන ගුණය අධි වේගයෙන් හෝ ඉතා සෙමින් කියන විට අඩු වී හෝ නොලැබී යන බවයි.

### පටිගත කර නැවත වාදනය කරන පිරිතෙහි ගුණ තිබිය හැකි ද?

පිරිත් වචනවල තේරුම ශ්‍රවණය කිරීම හා අවබෝධ කර ගැනීම මඟින් ලැබෙන ගුණය ඇතුළු වෙනත් ගුණයන් පිරිතෙහි තිබිය හැකි වුවද, පටිගත කළ පිරිත් නැවත වාදනයේදී පිරිතේ හඬ මඟින් ලැබෙන ගුණය නම් බොහෝ දුරට අඩු බව මෙහි දී දැක ගත හැකි විය. උසස් ධ්වනි ගුණයෙන් යුත් පටිගත කිරීමේ යන්ත්‍ර හා එය නැවත වාදනය කිරීම සඳහා යොදා ගන්නා ගුවන් විදුලි යන්ත්‍රයේ ධ්වනි ගුණය මත බොහෝ සෙයින් මෙම තත්ත්වය තීරණය වේ. විශේෂයෙන් ම කුඩා ස්පීකරයක් සහිත ගුවන් විදුලි යන්ත්‍රයක් හෝ පටි වාදනය කිරීමේ යන්ත්‍රයක් මඟින් දෙනු ලබන පිරිත් හඬ විශ්ලේෂණය කළ විට සුමුදු වක්‍රාකාර තරංග පෙළක් දක්නට නොලැබිණ. කුමන අන්දමේ පටිගත කිරීමේ හා නැවත වාදනය කිරීමේ යන්ත්‍රයකටත් වඩා මුඛ දේශනාවෙන් ලැබෙන පිරිත් හඬෙහි තරංගවල ධ්වනි ගුණය මඟින් මනස සන්සුන් වන බව මෙහි දී සොයා ගත හැකි විය.




සාමාන්‍ය සංගීතයේ දී තරංගවල ඇති සංකීර්ණ ස්වාභාවය (a) හා ඒකාග්‍ර නොවූ මනසකින් යුතුව පිරිත් කියන විට දී පවා පිළිවෙළකට තරංග සැකසෙන අන්දම (b) හා ක්‍රමවත්ව පිරිත් හෝ ගාථා කියන විට සුමට භාවයට පත් වූ තරංග කොටසක් (1) (c ඡායාරූපය මෙතරම් සුමට ලෙස පිරිත්වල දී බහුලව දක්නට නොලැබුන ද (a) හා (b) අවස්ථාවල දී ට වඩා සුමට ලෙස (c) හි තරංග හැසිරේ.)

රූපය 5

එහෙයින් පිරිතෙන් වැඩි ගුණයක් ලැබීමට නම් මණ්ඩපයේ සිට කරන්නා වූ පිරිත් සජ්ඣායනාවලට සවන් දීම, පටිගත කළ පිරිත්වලට සවන් දීම හෝ ශබ්ද විකාශන යන්ත්‍රවලින් නිකුත් වන හඬට සවන් දීමට වඩා බෙහෙවින්ම වැදගත් වේ.

මෙම ලිපියෙහි අන්තර්ගත වූයේ පිරිතෙහි, ධ්වනි ගුණය ගැන විශ්ලේෂණයක් පමණි. පිරිත්වල තිබිය හැකි වෙනත් ගුණ මෙම පර්යේෂණයට ලක් නොකැරිණි. මෙහිදී ලැබුණු ප්‍රතිඵලයට අනුව පිරිත් හෝ ගාථා කීම කළ යුත්තේ වචන පටලවා ගන්නා තරම් ඉතා වේගයෙන් වත්, ලතාවකට ඇද බැඳ සෙමින් වත් නොව, මධ්‍යම වේගයකිනි. පිරිත් ශ්‍රවණය මඟින් සිත කය සන්සුන් කිරීම සඳහා භාවනාවේ දී මෙන් ප්‍රතිඵල ලැබෙන අතර එහෙයින් ම එය රෝග නිවාරණය සඳහා ද ඉවහල් වේ.

මුඛ දේශනාවෙන් කරන පිරිත් ශ්‍රවණය නිසා ලැබෙන ගුණ (ධ්වනි ගුණය නිසා ලැබෙන ගුණ) පටිගත කළ හෝ ශබ්ද විකාශන, ගුවන් විදුලි යන්ත්‍ර මඟින් ලැබෙන පිරිත් හඬෙහි ගුණයට වඩා බෙහෙවින් ම වැඩි බව ද මෙහි ලා මතක තබා ගැනීම වටී.

- **මහාචාර්ය චන්දන ජයරත්න**

# 2018 මෙත් සවිය මව් කමිටුවේ පුරප්පාඩු වන නිලතල සඳහා ඉල්ලීම

**මෙත් සවිය මෛත්‍රී සංසදයේ වාර්ෂික මහ සමුළුව, පහලොස්වන වර්ෂ පූර්ණ සැමරුම සහ මෛත්‍රී භූෂණ සම්මාන උළෙල 2018 ජූනි මස 3 වන දින කොළඹ 05, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවතේ, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ දී**

මෙත් සවිය මව් කමිටුවේ පුරප්පාඩු වන නිලතල සඳහා ඉල්ලීමට කැමති සාමාජිකයින් පහත කොටස පුරවා නොපමාව මා වෙත (සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා) හෝ කාර්යාලයට තැපෑලෙන් හෝ ඊමේල් / ෆැක්ස් මඟින් හැකි ඉක්මනින් ලැබෙන්නට සලස්වන්න. මේ දින වල දිනපතා ම පාහෝ වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ දී ඉරුදින දහවල් භාවනා වැඩසටහනට පෙර හෝ පසුව හෝ දුරකථන ඇමතුමක් දී, පහසු වේලාවක පැමිණෙන හෝ හමුවිය හැකිනම් වඩා හොඳය. සුදුස්සන් තේරී පත්වනු ඇත.

මෙයට මෙත් සිතැති,

**මහාචාර්ය චන්දන ජයරත්න මහතා** (සභාපති)

දුරකථනය : 0714 800 800 Email : chandanajayaratne@gmail.com

---

# 2018 මෙත් සවිය මව් කමිටුවේ

**මව් / තරුණ / කාන්තා / අසරණ සරණ / දාන-සීල-භාවනා සුවසෙත / නීති / සුභසාධක කමිටු වල**

## නිලතල ඉල්ලීම සඳහා අයඳුම් පත්‍රය

**2016 - 2017** වසර දෙකෙහි නිලතල වල හෙබි සාමාජිකයින් නැවත එම තනතුරු සඳහා අයඳුම් නොකරන්න.

**නිළතල සඳහා ඉල්ලුම් කරන අය දහමට ලැදි, සමාජ සේවයට කැමති, මෙත් සවිය ගුණ වැඩීමේ ක්‍රමවේදය පුරුදු පුහුණුකරන තැන්පත් අය විය යුතුය.**

**ඉල්ලුම්කරනු ලබන කමිටුවේ නම** :........................................ සාමාජික අංකය :....................

නම :........................................................................

ලිපිනය :........................................................................

දුරකථන අංකය :.............................. විද්‍යුත් තැපෑල :..............................

........................................................................

ලබා ඇති අධ්‍යාපනික සුදුසුකම් :........................................................

අයඳුම්කරුගේ රැකියාව :.............................................. තනතුර :....................

රැකියා ස්ථානයේ ලිපිනය :........................................................

අයඳුම්කරුගේ පියා හෝ මව කල රැකියාව :..............................................

**තෝරාගැනීම පහසු වීම සඳහා වෙනත් අදාල විය හැකි කරුණු,**

ඔබ මෙත් සවිය මඟින් කර ඇති පරිත්‍යාග හා අනු කමිටුවල දරන ලද තනතුරු / පුහුණු වැඩසටහන් සඳහා (Please attach a separate sheet or CV)

එක් තනතුරකට වඩා ඉල්ලීම කල හැකිය. සුදුස්සන් තෝරාපත්කරන්නෙමු. කරුණාකර පහත කොටසේ කොටු තුල තමා වැඩිම කැමති තනතුර ඉදිරියෙන් 1 ලකුණ දමන්න. දෙවැනියට කැමති තනතුර ඉදිරියෙන් 2 ලකුණ දමන්න. තෙවැනියට කැමති තනතුර ඉදිරියෙන් 3 ලකුණ දමන්න. වත්මන් අනු කමිටු වල තනතුර ලාභීන්ට ද මෙම මව් කමිටු තනතුරු සඳහා ඉල්ලීම කල හැක. එහෙත් මව් කමිටුවට පත්වුවහොත් අනුකමිටු තනතුර අතහැරිය යුතුවේ.

**1. ගරු සභාපති** ☐ **2. ගරු උප සභාපති** ☐ **3. ගරු සම ලේකම්** ☐
**4. ගරු භාණ්ඩාගාරික** ☐ **5. ගරු උප භාණ්ඩාගාරික** ☐ **6. ගරු සංස්කාරක** ☐
**7. ගරු වෙබ් අඩවි කළමනාකරු** ☐ **8. ගරු කාරක සභික** ☐

ඉහත නිලතල බලාපොරොත්තු නොවන එහෙත් කමිටු සාමාජිකත්වය පමණක් බලාපොරොත්තු වන අය තමා කැමති කමිටුවේ / කමිටුවල නම / නම් (උපරිම කමිටු 2ක් පමණි) මෙහි ලියන්න. :..............................

අයඳුම්කරුගේ අත්සන :.............................. දිනය : 2018 / ............../ ..............



# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

# අසරණ සරණ ශිෂ්‍යත්ව අරමුදල

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06. දු: ක: 071 401 4467, 011 250 5088
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org

## ශිෂ්‍යත්ව ප්‍රදානය කරන්නට කැමති පිංවතුන් විසින් පිරවීම පිණිසයි.

සාමාජික අංකය :.............................................

දානපති / පතිනියගේ නම :.............................................

ලිපිනය :.............................................

දුරකථන අංක :.............................................

මා විසින් මසකට රුපියල් 500 / 600 / 750 / 1000 / හෝ කැමති ගණනක් රු.............................. බැගින් වන ශිෂ්‍යත්ව .............................. ක් අවුරුදු .............................. තුළ දී හෝ දරුවන් උසස් අධ්‍යාපනය නිමා කරන තෙක් ලබා දීමට කැමති බැව් දන්වන අතර එම ශිෂ්‍යත්ව පිරිමි / ගැහැණු දරුවන් .............................. දෙනෙකුට ලබාදීමට කටයුතු යොදන ලෙස ඉල්ලමි. නැතහොත් මාස 3 කට / 6 කට / 12 කට වරක් එකවර එම මුදල කාර්යාලයට ලබා දෙන බවට පොරොන්දු වෙමි.

දිනය :.............................................

අත්සන :.............................................

# නිවේදන සහ නොමිලයේ පළකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

මෙත්සවිය පුවත් සගරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපිද, දාන - ශීල - භාවනා වැඩසටහන්වල දී දායකත්වය දරන පිංවතුන් ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන් ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිලයේ පලකරනු ලැබේ. කොළ කැබලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තැබිය යුතුය. ඔබගේ ලිපිනය ලියා දිම සඳහා භාවනා වැඩසටහන්වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවල ද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබී යාම පිළිබඳව වගකියනු නොලැබේ.

## මෙත් සවිය දුරකතන අංක

මෙත් සවිය තොරතුරු විමර්ශනය කරනවිට, **පරිපාලන නිලධාරී මහතා අමතන්න. (011-2505088, 0714-014467)**. එම දුරකතනවල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි.

අපගේ **වෙබ් අඩවි වන www.methsaviya.org** සහ **www.methsaviya.lk** මඟින්ද තොරතුරු ලබා ගත හැකිය.

මීට අමතරව සම ලේකම් වන චින්තක බණ්ඩාර මහතාගේ පුද්ගලික දුරකතන අංකය (0718 114 477) අමතා ද හදිසි තොරතුරු ලබාගත හැක.

සංසදයේ **සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක 0714 800 800 හෝ 0777 309 385** මඟින් **දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක්** (ඉතා හදිසි අවශ්‍යතාවයක දී සෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකථන පණිවුඩ 30 ක් පමණ ලැබෙන නිසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## මීළඟ 39 වන භාවනා වැඩසටහන

39 වන භාවනා වැඩසටහන 2018 ජුනි මස 24 ඉරු දින ඇරඹීමට නියමිතය. ඒ සඳහා 2018/06/17 දින තෙක් නව අයදුම්පත් භාරගනු ලැබේ. තවද සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමාජිකයින්ට ද ඒ සඳහා සහභාගි විය හැක. සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.

## පංච අභිඥා සහ අධිමානසික විද්‍යාව පිළිබඳ 36 වන වැඩමුළුව

ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 33 වන වැඩමුළුව 2018 - 07 - 15 දින පෙරවරු 10.00 ට ආරම්භ වේ. 37 වන වැඩමුළුව සඳහා අයදුම්පත් 2018 - 06 - 15 දිනට පෙර භාරදෙන්න. ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ.


### කොළඹ 5 කිරුළපන

බේස්ලයින් පාරට ඇවිදින දුරින් (100m)

**පර්චස් 6ක වටිනා ඉඩමක් විකිණීමට තිබේ**

075 429 1970 අමතන්න.

රම්‍යා මාලතී (සා:අං: 38-5908)

### ගණකාධිකරන හා මුල්‍ය සේවා

පලපුරුදු, වෘත්තීය ගණකාධිකාරිවරයෙකු වන මෙත්සවිය සාමාජිකයකු තනි පුද්ගල/ හවුල් ව්‍යාපාර, සමාගම් ඇතුළු සියලු ව්‍යාපාරවල විගණනය, ගිණුම් පිළියෙලකිරීම්, ආදායම් බදු හා මුල්‍ය කළමනාකරණ උපදෙස් හා සේවාවන් සාධාරණ ගාස්තු යටතේ සපයනු ලැබේ.

**විස්තර : 077 2355117 අමතන්න.**

### දිදුලක ක්‍රියේෂන්ස්

විසිතුරු නිර්මාණ සමඟින් අලංකාරවත් ලෙස **මුතුකුඩ නිර්මාණය**

මනාලියන්ගේ සහ උත්සව අවස්ථාවන් සඳහා **සාරි නිර්මාණය කරනු ලැබේ**

**සාමජිකා - දිලිනි**

බොරලැස්ගමුව - **0773904405**

ප්ලාස්ටික් ප්‍රතිශක්තීකරණය කර පිගන්/ කෝප්ප / වට්ටි ආදිය තැනීම රැකියාව කරගත් සාමාජිකාවකට (සා.අංක. **34-5228**) නැගී සිටීමට අතහිත දෙන්න...

**ඔබ නිවසේ විසිකරන අනවශ්‍ය ප්ලාස්ටික් ද්‍රව්‍ය තිබේ නම්**

පොල්තෙල් බෝතල්/අයිස්ක්‍රීම් පෙට්ටි/ වතුර බෝතල් ආදිය භාර දීමට විමසන්න - **0772 353 392**

### සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්


**SIGHT 'N' STYLE OPTOMETRISTS**

නො. 126 බී, හයිලෙවෙල් පාර, නුගේගොඩ.
(අනුලා විදුහල ඉදිරිපිට) දුරකථන : 2854758

**(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න)**

### ජල රකුසාගෙන් ගැලවෙමු ග්‍රන්ථය

කර්තෘ : පියදාස සිල්වා (සා:අ: 15-2738)




- භාවනාව
- ධර්ම දානය
- අභය දානය සඳහා කියවන්න

★ දියේ ගිලීමට ★අමනුස්ස බලපෑම්
★ අකල් මරණ අවමයට
★ ඇමෙරිකාවත් මෛත්‍රී භාවනාවට
★ ලොව ඉහළම කුසලයට
★ බුදුන් වහන්සේට මල් පිදීම තුලින් ...

**මුද්‍රණ වියදම රු. 350**
**අලෙවි මිල රු. 250**
දු:ක: 075 712 8960

# මෙත් සවිය මනස අධ්‍යාපන මෛත්‍රී සංසදය - සාමාජික අයදුම්පත

(ඡායා පිටපත් ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)

01. සම්පූර්ණ නම ....................

02. ස්ත්‍රී / පුරුෂ භාවය .................... 3. ජාතික හැඳුනුම්පත් අංකය ....................

(ඡායා පිටපතක් අමුණන්න)

04. උපන් දිනය .................... 5. වයස .................... 6. ආගම ....................

07. ස්ථිර ලිපිනය ....................

විද්‍යුත් තැපෑල (e-mail) .................... දු:කඃ නිවස .................... ජංගම ....................

08. දිස්ත්‍රික්කය .................... 9. විවාහක / අවිවාහක බව ....................

10. දරුවන් සිටිනම් විස්තර : ගැහැණු දරුවන්ගේ වයස් .................... / පිරිමි දරුවන්ගේ වයස් ....................

11. රැකියාවක් කරන්නේ නම්, රැකියාව ...................., ආයතනයේ නම ....................

(ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ....................

12. කාර්යාලීය විස්තර හා දුරකථන විස්තර ....................

13. ලිපි එවිය යුතු ලිපිනය ....................

14. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්,

1. ....................

2. ....................

15. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර,

1. ....................

2. ....................

3. ....................

16. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ....................

17. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද ? ඔව් / නැත .

18. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර.

....................

19. ඔබ විසින් සඳහන්කළ යුතු මෙහි දී වැදගත් යැයි හැඟෙන වෙනත් විස්තර හෝ යෝජනා / අදහස් තිබේ නම් මෙහි සඳහන් කරන්න. ....................

....................

**මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.**

දිනය .................... අයදුම්කරුගේ අත්සන ....................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය ....................

.................... ....................

තේරීම් කමිටු සභාපති විධායක ලේකම් දිනය ....................

සැ:යු:- ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශණා, වැඩමුළු, මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම්, හැඳුනුම්පත් සැකසීම, තැපැල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිළධාරී මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු. 2,500 /- ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (එය ඇතුළත්වීමේ ගාස්තුව රු. 1,500 /- හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500 /- X 2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය සඳහා තම ආදායම තහවුරු කළ හැකි ලිපි ලේඛන සහ තම විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නිර්දේශය සහිත ග්‍රාම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ) කාර්යාලය සඳුදා, අඟහරුවාදා, හැර සතියේ ඉතිරි දිනයන්හි සෙනසුරාදා, ඉරිදා ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සෑම කෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍යනම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 9X4 ප්‍රමාණයේ නම, ලිපිනය ලියූ මුද්දර කවර 2 ක් සමඟ පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමු කරන්න. (අයදුම්පත සමඟ කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)

ලිපිනය :- ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 06, දුරකථන : 0112 505088, 0714 014467, www.methsaviya.org / www.methsaviya.lk

## අපවත් වී වදාළ

ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත,
වංසාලංකාර අමරපුර නිකායේ ගරු අධිකරණ සංඝනායක

# අතිපූජ්‍ය අහංගම ආනන්ද හිමි

# ගුණානුස්මරණය



## අභය දානයෙන් ලොව සැනසූ අපවත් වී වදාළ

## අතිපූජ්‍ය අහංගම ආනන්ද නායක අපේ හාමුදුරුවෝ...

මෙත් සවිය පසලොස් වසරක ආගමික මෙහෙවර සමරණ මේ මොහොතේ වසර 15කට ආසන්න කාලයක් අපව දිරිමත් කරමින්, රකිමින්, මෙත් සවියේ පරමාර්ථ සපුරාලීමට උදව් දෙමින්, දයාබරිත, කරුණාබර, මෙත් කුළුනක් වූ මෙත් සවිය අනුශාසක ව සිටි ස්වාමීන් වහන්සේ අවුරුදු 86ක් ආයු වළඳා 2018.04.06 වන දින රාත්‍රියෙහි දී කොළඹ ජාතික රෝහලේ දී සිහි නුවණින් යුක්තව අවසන් හුස්ම හෙළා වදාළ සේක. කෘතගුණ දැක්වීමක් වශයෙන් අපට කළ හැකි පමණින් උන් වහන්සේගේ ශ්‍රී දේහයේ අවමංගල්‍ය කටයුතු සඳහා සහ රන් සිරිගෙය සඳහා ජයරත්න මල් ශාලාව වෙත ගෙවිය යුතු වූ බරපැන දැරීම ඇතුළු අවමංගල පුණ්‍යෝත්සවයේ බොහෝමයක් කටයුතු වලට දායක වීමට හැකි විය.


කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්මගවේෂි බෞද්ධාශ්‍රමයේ දී මෙත් සවිය පිහිටුවා පළමු වැඩසටහන අවසානයේ දී ම අප පළමු කණ්ඩායමේ සාමාජිකාවක් ව සිටි සත් ගුණවත් වජිරා මෝතා මහත්මියගේ මගපෙන්වීම මත අප 2003 වසරේ සිට අහංගම ආනන්ද මාහිමිපාණන්ගේ සෙවණෙහි ශ්‍රී විජයාරාමයට පැමිණ, මෙත් සවිය කාර්යයාලය පිහිටුවා දහස් ගණන් ජනතාව සසර දුකින් එතෙර කරවීම සඳහා විදර්ශනා භාවනාව හා සමථ භාවනා වැඩසටහන් 39කට අධික ප්‍රමාණයක් පවත්වාගෙන ගියෙමු.

සෑම ඉරු දිනකම පස්වරු 2.00 ට භාවනා වැඩසටහන ඇරඹෙන විට අපේ ආනන්ද හාමුදුරුවෝ සිනහ මුහුණින් වැඩම කොට පිරිස ආජීව අෂ්ඨමක සීලයෙහි පිහිටුවා, කෙටි අනුශාසනාවක් ද පවත්වා චරිතය තැනීම සඳහා කෙටි ඔවදන් කීපයක් දීම නොකඩවා සිදු කරමින් අපට මහත් දිරියක් දෙන ලදහ. උන්වහන්සේ බොහෝ විට එම කටයුත්ත අවසන් කර ඉවතට වැඩම කිරීමට පෙර අසරණ සරණ සඳහා රෝද පුටු, කිහිළි කරු ආදිය අප සාමාජිකයින්ගේ පරිත්‍යාගයෙන් අසරණ අයෙකුට ලබා දීම පුරුද්දක් කොට පැවැත්විය. අවසන් කාලයේ උන් වහන්සේගේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාද්වීපයට බුදුන් ප්‍රථම වරට වැඩම කළ මහියංගනය රාජ මහා විහාරස්ථානයේ ප්‍රමාණවත් බුදු පිළිමයක් නොමැති අඩුව සපුරාලීම සඳහා බුද්ධ ශාසනය අවසානය තෙක් පවතින රට ලෙස සැලකෙන ශ්‍රී ලංකාද්වීපයෙහි මහියංගනය පුද බිමෙහි චිරාත්කාලයක් පවතින අඩි 84 ක් උසැති, ආධාරකයක් නොමැතිව අහසින් වඩිනා ආකාරයට තනනු ලබන ලක්දිව උස ම හිටි පිළිමය තැනීමේ මෙත් සවිය කටයුත්ත නිමා කිරීමටය. එහෙත් එය උන් වහන්සේ දෙනෙත් පියා ගැනීමට පෙර අපට නිමකර ගත නොහැකි වීම ගැන අප මහත් කණගාටුවට පත් වුනෙමු.

මරණයට කැප වූ ගවයින් 7,000 ක ට ආසන්න ප්‍රමාණයකට අභයදානය දුන් උන් වහන්සේ, එළුවන්, පාත්තයින්, තාරාවුන් වැනි සතුන් පමණක් නොව නාගයින්ට පවා අභය දානය දුන් මහා දානපතියෙකි. දඹානේ ආදිවාසීන්ට අප සමග ගොස් කිරි ගවයින් ලබා දී නායක වන්නිලැ ඇත්තෝ සමඟ ආදිවාසීන් කීප දෙනෙකු ම නිර්මාන්ශ ආහාරී පුද්ගලයන් බවට පත් කිරීමට උන් වහන්සේ දුන් ඔවදන් වලින් හැකි වීම ප්‍රාතිහාරයකි.

මහරගම පිළිකා රෝහලෙහි අප කළ වැඩසටහනක දී එහි නම වෙනස් කළ යුතු බව සනිටුහන් කළ උන්වහන්සේගේ ක්‍රියාත්මක වීම තුලින් අද එහි නම "මහරගම අපේක්ෂා රෝහල" බවට පත් වී ඇත. රට වටේට ම වඩිමින් අප කළ සිද්ධස්ථාන නගාසිටුවීමේ වැඩසටහන් වලට අනුශාසකත්වය ලබාදෙමින්, නාගදීපයෙහි වැසිකිලි පද්ධතියක් තැනීම, මිරිසවැටිය සලපතල මළුවේ කොටසක ගල් ඇතිරවීම, සත්ත්ව හිංසනය වැලැක්වීම සඳහා නව අණ පනත් තැනීම සඳහා රජය යොමුකරවීම, ආරෝග්‍යශාලා වලට බුදු පිළිම සහ උපකරණ සැපයීම ඇතුළු බොහෝ පුණ්‍යකර්ම වලට සහයෝගය දුන් උන් වහන්සේ අප හදෙහි සදා අමරණීය වේ.

**බෝසත් ගුණැති උන් වහන්සේට පතන්නා වූ බෝධියකින් නිවන් සුව අත්පත් වේවා! යි**
**මෙත් සවියේ අප දරු දැරියෝ ප්‍රාර්ථනා කරන්නෙමු.**




# අපවත් වී වදාළ

ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත, වංසාලංකාර අමරපුර නිකායේ ගරු අධිකරණ සංඝනායක

# අතිපූජ්‍ය අහංගම ආනන්ද හිමියන්ගේ

# ආදාහන පුණ්‍යෝත්සවය






















අතිපූජ්‍ය අහංගම ආනන්ද හිමියන්

# අපවත් වී සත් දිනක් නික්මීම නිමිත්තෙන් සිදු කරන ලද පුණ්‍යකර්මයන්...

ධර්ම දේශනය





ධර්ම දේශනය - කැටවල හේමාලෝක හිමිපාණෝ



සාංඝික දානය





## අති පූජ්‍ය අහංගම ආනන්ද හිමිගේ ජන්ම දිනය නිමිත්තෙන් ගැබිණි මාතාවන්ට අවශ්‍ය උපකරණ ලබාදීම









## ශ්‍රවණාබාධ සහිත පුද්ගලයින් වෙත ලක්ෂ 35 ක් වටිනා ශ්‍රවණාධාර උපකරණ 77 ක් ලබාදීම













## මහියංගනය පුදබිමට පැමිණෙන පිංවතුන්හට බුදු පිළිමය නෙළීම සඳහා ආධාර ටිකට් පත් අලෙවි කිරීම







## මෙත් සවිය කමිටු සාමාජිකයින් සඳහා පැවැත් වූ නායකත්ව පුහුණු වැඩසටහන් මාලාවේ අවස්ථාවන් කිහිපයක්...










## 2018 දුරුතු මස 01 වන දින වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ දී පැවැත් වූ සීල සහ අනේවාසික භාවනා වැඩසටහන















## 2018 ජනවාරි 1 වන දින කේෂධාතූන් වහන්සේ වෙත වසරේ ප්‍රථම බුද්ධ පූජාව සහ මහා සංඝරත්නය විෂයෙහි හීල් දානය, කොළඹ හුණුපිටියේ ගංගාරාම විහාරස්ථානයේ දී පැවැත්වීම.

















2018 දුරුතු මස 01 වන දින වැල්ලවත්ත ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ දී,
මතු බුදුවන මෛත්‍රී බෝසතානන් වහන්සේගේ (නාථ දෙවිඳුන්ගේ)

# ප්‍රතිමාවහන්සේ නිරාවරණය කිරීම.....





**මෙම දහම් සඟරාව මුද්‍රණය කිරීම සඳහා පූර්ණ දායකත්වය දැරූ අරිසෙන් අහුබුදු ශූරීන්ගේ දියණිය, සමන්ති අහුබුදු මැතිණියටත් එම පවුලේ සැමටත් මෙත් සවිය පුණ්‍යානුමෝදනා පූර්වක ස්තුතිය පුදකෙරේ.**

මුද්‍රණය - දිනකර මුද්‍රණාලය 2/99, නාවල පාර, නුගේගොඩ 011 2827044 / 0712 285 680 Email : dinakara.priyantha@gmail.com,